# II 1967 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම[1]

1967 දී, ලංකාව මූර්ත නිමැවුමේ සැලකිය යුතු දියුණුවක් ලබාගත්තේය. දේශීය කෘෂිකර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ ඇතිවූ ඉහළ නිමැවුම් මට්ටම, මෙම ආර්ථික දියුණුවේ ප්‍රධාන අංගය විය.

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1967 දී, ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා මිල අනුව සියයට 4·9 කින් ඉහළ ගොස් ඇත. ස්ථාවර මිල අනුව මෙම වැඩිවීම සියයට 4·2 කි. මෙම ධෛර්‍යජනක සුළු හැඩ ගැස්මට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, දේශීය කෘෂිකර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ ඉහළ නිමැවුම් මට්ටමය. ඒකජන මිනුමෙන් මනින කළ, දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා මිල අනුව සියයට 2·7 කින් සහ ස්ථාවර මිල අනුව, සියයට 2·0 කින් වැඩිවිය. කෙසේ නමුත් මෙම වාසි, ලංකා ආර්ථික ක්‍රමය කෙරෙහි පවත්නා විදේශීය වෙළඳාමේ වැදගත්කම හේතුකොට ගෙන, ලංකාවේ වෙළඳ අනුපාතයේ, ඇතිවූ වෙනස් වීම් අනුව සලකා බැලිය යුතුය. 1967 දී වෙළඳ අනුපාතය සියයට 9·4 කින් පහත හෙළමින් අපනයන මිල සියයට 6·3 කින් පහත වැටුණු අතර, ආනයන මිල සියයට 3·4 කින් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලය වූයේ, ලංකා වේ මූර්ත නිෂ්පාදනය සියයට 4·2 කින් ඉහළයාම වූ අතර, ලංකාවේ මූර්ත ආදායම සියයට 2·2 කින් පමණක් ඉහළ යාමය.

1966 සංශෝධිත වටිනාකම හා සසඳා බලන කළ රු. දශ ලක්ෂ 7,587 ක් වූ දළ ජාතික නිෂ්පාදිතය පවත්නා මිල අනුව, 1967 දී රු. දශ ලක්ෂ 7,962 ක් වශයෙන් තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය සියයට 4·9 ක වැඩිවීමකි. 1967 දී දළ ජාතික නිශ්පාදිතය වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ, දේශීය කෘෂිකර්මාන්තයේ ශුද්ධ නිමැවුම වැඩිවීමය. රබර්වල සාමාන්‍ය මිල පහල වැටීම සහ තේ සහ පොල් මිල සහ නිෂ්පාදන පරිමාව යන දෙකම පහත වැටීම හේතු කොට ගෙන තේ, පොල් සහ රබර් කර්මාන්තයේ ශුද්ධ නිමැවුම පහත වැටිණි. මෙම වෙනස්වීම්වල අනිෂ්ඨ විපාක, කෙසේ වෙතත්, වී, මාළු, අතිරේක ආහාර භෝග සහ පශුධන නිෂ්පාදනවල ශුද්ධ නිමැවුම පමණට වඩා වැඩිවීමෙන් කැපී ගියේය.

1966 දී පැවති වී නිෂ්පාදිතය බුසල් දශ ලක්ෂ 45.7 1967 දී මෙතෙක් වාර්තා ගත වී ඇති ඉහළම මට්ටම වූ බුසල් දශ ලක්ෂ 55.1 දක්වා ඉහළ ගියේය. මෙය සියයට 20·6 ක වැඩිවීමකි. මාළු නිෂ්පාදනය සියයට 20.4 කින් ඉහළ ගියේයයි ඇස්තමේන්තු කර ඇත. අතිරේක ආහාර භෝග හා පශුධන නිෂ්පාදන වලින් එකතු වූ අගය, එනම්, කිරි හා බිත්තර පිළිවෙලින් සියයට 5.3 කින් හා 4.5 කින් ඉහළ ගියේයයි, තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. 1967 දළ දේශීය නිෂ්පාදිතය වැඩිවීමට වෙනත් අංගවල ප්‍රසාරණයද හේතු විය. බැංකු හා රක්ෂණ කටයුතු වලින් එකතු වූ අගය සියයට 23·8 කින්ද. තැනීම් කටයුතු වලින් සියයට 16·9 කින් සහ සේවාවන්ගෙන් සියයට 5.6 කින් ද වැඩිවිය.

ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය 1966 දී පැවති රු. දශ ලක්ෂ 7,613 සිට 1967 දී රු. දශ ලක්ෂ 7932 දක්වා, ඉහළ ගියේය. මෙය සියයට 4·2 ක වැඩිවීමකි. මෙය, වී, මාළු, රබර්, පශුධන නිෂ්පාදන, සමහර කාර්මික නිෂ්පාදන, විශේෂයෙන්ම, සිමෙන්ති හා දුම්කොළවලින් 1967 ලද ඉහළ නිමැවුම් මට්ටම පිළිබිඹු කරයි.

---

1 (අ) බැංකුව ලද සංශෝධිත මූලික සංඛ්‍යා තොරතුරු සඳහන් කිරීම (ආ) සම්මත ක්‍රමයන්ට අනුවම යායුතු නිසා ඇස්තමේන්තු ආගණනය කිරීමේදී දියුණු ක්‍රම භාවිතා කිරීම හේතුවෙන් මෙම වාර්තාවේ සඳහන් 1967 ට පෙර වර්ෂය සඳහා වූ ජාතික නිෂ්පාදිතය සහ වියදම් පිළිබඳ සමහර ඇස්තමේන්තු වලින්, පසුගිය වාර්තාවල සඳහන් එම ඇස්තමේන්තු වෙනස් වේ.

## සංඛ්‍යා සටහන II (අ) 1

## නිෂ්පාදනය හා වියදම්

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **අ. වටිනාකම්** | | | | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය සාධක වියදම් මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. | 5,893·3 | 6,286·8 | 6,313·3 | 6,502·5 | 6,796·7 | 7,290·5 | 7,376·9 | 7,587·4 | 7,962·6 |
| (2) දළ දේශීය වියදම වෙළඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 5,576·0 | 6,849·3 | 6,875·6 | 7,011·4 | 7,412·7 | 7,892·1 | 7,833·5 | 8,270·5 | 8,920·8 |
| (3) පෞද්ගලික පාරිභෝජනය වෙළෙඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. .. | 4·582·2 | 4,960·6 | 4,847·9 | 4,951·6 | 5,241·8 | 5,688·9 | 5,675·5 | 6,054·1 | 6,455·8 |
| (4) රජයේ පාරිභෝජනය වෙළෙඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) | 881·3 | 911·0 | 926·2 | 979·4 | 1,010·6 | 1,090·1 | 1,156,7 | 1·158·3 | 1,228·3 |
| (5) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වෙළෙඳ මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 1,118·1 | 1,022·1 | 1,037·4 | 1,100·8 | 1·095·3 | 1,119·6 | 1,031·1 | 1,120·0 | 1,256·9 |
| (6) භාණ්ඩ අපනයන සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. | 2,016,0 | 2,010·6 | 1,907·2 | 1,971·0 | 1,902·6 | 1,937·1 | 2·094·5 | 1,864·9 | 1,827·3 |
| (7) භාණ්ඩ ආනයන සහ සාධක නොවන සේවා (රුපියල් දශ ලක්ෂ) .. .. | 2,175·7 | 2,208·5 | 1,972·0 | 2,070·3 | 2,030·9 | 2,101·9 | 2,060·9 | 2,154·7 | 2,125·2 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය ප්‍රතිශීර්ෂ වශයෙන් සාධක මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 612·3 | 635·3 | 620·9 | 622·7 | 634·5 | 664·5 | 656·8 | 660·3 | 678·2 |
| (9) දළ දේශීය වියදම ප්‍රතිශීර්ෂ වශයෙන් (රුපියල් දශ ලක්ෂ | 683·2 | 692·1 | 676·2 | 671·4 | 692·0 | 719·4 | 697·4 | 719·7 | 759·8 |
| (10) දළ ජාතික නිෂ්පාදිතය 1959 සාධක වියදම් මිල අනුව (රුපියල් දශ ලක්ෂ) .. | 5,893·3 | 6,288·5 | 6,424·7 | 6,709·9 | 6,899·7 | 7,363·3 | 7,444·8 | 7,613·1 | 7,932·1 |
| (11) දළ ජාතික නිෂ්පාදිතය ප්‍රතිශීර්ෂ වශයෙන් 1959 සාධක වියදම් මිල අනුව (රුපියල්) . | 612·3 | 635·5 | 631·9 | 642·5 | 644·1 | 671·2 | 662·8 | 662·5 | 675·6 |
| **ආ. දර්ශක අංක (1959=100)** | | | | | | | | | |
| (1) දළ ජාතික නිෂ්පාදිතය සාධක මිල අනුව .. .. | 100·0 | 106·7 | 107·1 | 110·3 | 115·3 | 123·7 | 125·2 | 128·7 | 135·1 |
| (2) දළ දේශීය වියදම් වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 104·2 | 104·6 | 106·6 | 112·7 | 120·0 | 119·1 | 125·7 | 135·7 |
| (3) පෞද්ගලික පාරිභෝජනය වෙළෙඳ මිල අනුව .. | 100·0 | 108·3 | 105·8 | 108·1 | 114·4 | 124·2 | 123·9 | 132·1 | 140·9 |
| (4) රජයේ පාරිභෝජනය වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 103·4 | 105·1 | 111·1 | 114·7 | 123·7 | 131·2 | 131·4 | 139·4 |
| (5) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වෙළෙඳ මිල අනුව .. .. | 100,0 | 91·4 | 92·8 | 98·5 | 98·0 | 100·1 | 92·2 | 100·2 | 112·4 |
| (6) භාණ්ඩ අපනයන සහ සාධක නොවන සේවා .. | 100·0 | 99·7 | 94·6 | 97·8 | 94·4 | 96·1 | 103·9 | 92·5 | 90·6 |
| (7) භාණ්ඩ ආනයනය සහ සාධක නොවන සේවා .. | 100·0 | 101·5 | 90·6 | 95·2 | 93·3 | 96·6 | 94·7 | 99·0 | 97·7 |
| (8) දළ ජාතික නිෂ්පාදිතය ප්‍රතිශීර්ෂ වශයෙන් සාධක මිල අනුව .. .. | 100·0 | 103·8 | 101·4 | 101·7 | 103·6 | 108·5 | 107·3 | 107·8 | 110·8 |
| (9) දළ දේශීය වියදම් ප්‍රතිශීර්ෂ වශයෙන් .. .. | 100·0 | 101·3 | 99·0 | 98·3 | 101·3 | 105·3 | 102·1 | 105·3 | 111·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

සමහර ආර්ථික ක්ෂේත්‍රයන්හි 1967 දී නිමවුමේ වර්ධනයක් ඇති වූ නමුත්, මූර්ත නිමැවුමේ ඇතිවන වෙනස්වීම්, වෙළඳ අනුපාතයේ ඇතිවන වෙනස්වීම් හා ගැලපීමෙන් ලබාගනු ලබන මූර්ත ජාතික ආදායමට නැවත වරක් අහිතකර ලෙස බලපාමින් ලංකාවේ වෙළඳ අනුපාතය 1966 දී වූ සියයට 13.1 ක පහත වැටීම හා සසඳා බලන කල සියයට 9.2 කින් පහළ වැටිණ. මූර්ත නිමැවුම සියයට 4·2 කින් වැඩි වූ අතර, මූර්ත ජාතික ආදායම වැඩිවූයේ සියයට 2·2 කින් පමණි. 1967 දී, සියයට 2·2 ක් වූ ජනගහනයේ වර්ධනයට වඩා මූර්ත නිෂ්පාදනයේ වර්ධනය වැඩිවිය. මේ නිසා ඒකජන මූර්ත නිෂ්පාදනය සියයට 2·0 කින් වැඩි විය. අනික් අතින් බලන කල මූර්ත ආදායමේ වැඩිවීම, ජනගහනයේ වැඩිවීමේ වේගය හා සමාන බව පෙනේ. මේ නිසා 1967 දී ඒකජන මූර්ත ආදායම නොවෙනස්ව පැවතුනි.

පාරිභෝජන භාණ්ඩ ආනයනය 1967 දී, සැලකිය යුතු ලෙස පහළ වැටිණි. එහෙත් දේශීය නිමැවුමේ උසස් මට්ටමක් පිළිබිඹු කරමින්, පෞද්ගලික පාරි- භෝජන වියදම ඉහළ ගියේය. 1967 දී රජයේ පාරිභෝජනයද ඉහළ ගියේය. ප්‍රාග්ධන සම්පාදනය කිරීම, විශේෂයෙන්ම ගොඩනැගිලි තැනීමේ දියුණුවක් 1967දී, දිස්විය. කෙසේ වෙතත් පෞද්ගලික සහ පොදු පාරිභෝජනය සහ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය කිරීම ආදියෙන් සංයුක්තවූ සමස්ත ඉල්ලුම ඉකුත් වසියේදී මෙන් සමස්ත සැපයුමට වඩා වැඩිවිය. මෙය ලංකාවේ ගෙවුම් ශේෂයේ, වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 329 ක හිඟයෙන් පිළිබිඹු විය.

### නිෂ්පාදනය හා වියදම - මුදලින්

දේශීය කෘෂිකර්මාන්තයේ සැලකිය යුතු ප්‍රසාරණයක් ඇතිවීම නිසා 1967 වර්ෂය කැපී පෙනේ. 11 (අ) 2 සංඛ්‍යා සටහන කාර්මික මූලයන්ට අනුව, දළ දේශීය නිෂ්පාදනය දක්වයි. අපනයනය සඳහා වගා වූ තේ, රබර් සහ පොල් ද, වන කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ද, ඇතුළත් වූ කෘෂිකර්මාන්තයෙන් මුළු දළ දේශීය නිෂ්පාදිතයට සියයට 35·8 එකතු විය. මේ නිසා මෙම ක්ෂේත්‍රයේ නිමැවුමේ ඇතිවන වෙනස්කම්, මුළු දළ දේශීය නිෂ්පාදිතයේ ඇතිවන වෙනස්කම් කෙරෙහි තීර- ණාත්මක බලපෑමක් ඇති කළේය. තේ, රබර් සහ පොල් වගා කර්මාන්තවල ශුද්ධ නිමැවුම 1967 දී සියයට 2·9 කින් පහළ වැටිණි. එහෙත් පවත්නා සහ ස්ථාවර මිල අනුව සලකා බලන කළ, සමස්ත කෘෂිකර්මාන්තයේ, වන කර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට, දේශීය කෘෂිකර්මාන්- තයේ සහ ධීවර කර්මාන්තයේ ඇති වූ ප්‍රසාරණය බොහෝ දුරට ප්‍රමාණවත් විය. වටිනාකම් එකතුවක් සේ ආගණන කළ විට, දේශීය කෘෂිකර්මාන්තයේ ඇතිවූ ප්‍රසාරණය පවත්නා මිල අනුව, සියයට 19·2 විය. ස්ථාවර මිල අනුව සලකා බලන කළ වැඩිවීම සියයට 12·2 ක් විය. සමස්ත කෘෂිකර්මාන්තයේ, වන කර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ එකතු වූ වටිනාකම් වැඩිවීම, පවත්නා මිල අනුව, සියයට 9·0 ක් සහ ස්ථාවර මිල අනුව 6·6 ක් වශයෙන් සටහන් වී ඇත.

මෑත අවුරුදුවල, දේශීය කෘෂිකර්මාන්ත නිමැවුමේ ප්‍රසාරණය, අපනයන භාණ්ඩවල මිල පහත වැටීම හා සම්බන්ධ වීමෙන් සමස්ත කෘෂිකර්මාන්තයේ වන කර්මාන්තයේ සහ ධීවර කර්මාන්ත කොටසෙහි වූ දේශීය කෘෂිකර්මාන්තයේ, සාපේක්ෂක වැදගත්කම වැඩිවීම සලකා බැලීම ප්‍රයෝජනවත්ය. මේ අනුව 1959 දී, මෙම ක්ෂේත්‍රයේ මුළු නිමැවුමෙන් සියයට 46·6 ක් දේශීය කෘෂිකර්මාන්තයේ, වන කර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ ශුද්ධ නිමැවුමෙන් යුක්ත වූ බව පෙනේ. 1967 දී මෙම අනුපාතය සියයට 59·0 දක්වා වැඩිවිය.

## සංඛ්‍යා සටහන II (අ) 2
## දළ ජාතික නිෂ්පාදිත
## පවත්නා සාධක මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
| 1. කෘෂි කර්මය, දව ඇ වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්ත .. | 2,302·4 | 2,389·7 | 2·456·1 | 2,392·3 | 2,600·2 | 2,663·5 | 2,527·6 | 2,632·4 | 2,870·0 |
| 2. පතල් හා ගල් කැඩීම් .. | 31·3 | 32·2 | 31·7 | 33·4 | 30·0 | 33·1 | 34·1 | 35·0 | 38·5 |
| 3. නිෂ්පාදනය .. .. | 682·1 | 711·7 | 709·5 | 748·9 | 783·6 | 819·4 | 887·8 | 844·2 | 864·3 |
| 4. ගොඩනැංවීම් .. .. | 282·9 | 283·1 | 279·1 | 297·0 | 285·4 | 306·3 | 284·4 | 289·6 | 338·6 |
| 5. විදුලි ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | 9·5 | 9·8 | 10·4 | 11·1 | 11·4 | 12·9 | 13·5 | 14·3 | 15·1 |
| 6. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | 540·9 | 587·3 | 578·9 | 633·6 | 636·6 | 706·3 | 762·8 | 818·1 | 839·9 |
| 7. තොග සිල්ලර වෙළෙඳාම .. | 800·8 | 936·5 | 872·8 | 954·4 | 971·2 | 1,146·6 | 1,163·1 | 1,213·3 | 1,169·9 |
| 8. බැංකු, රක්ෂණ හා අනෙකුත් මූල්‍ය .. | 50·9 | 51·5 | 58·4 | 64·5 | 68·5 | 5·9 | 93·2 | 85·8 | 106·2 |
| 9. නිවාස අයිතිය .. .. | 200·6 | 213·5 | 233·1 | 248·6 | 260·3 | 275·3 | 294·0 | 314·0 | 335·5 |
| 10. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. | 301·0 | 314·4 | 323·5 | 343·7 | 365·1 | 363·3 | 371·9 | 396·5 | 402·9 |
| 11. සේවා .. .. .. | 727·6 | 801·3 | 799·7 | 821·5 | 836·9 | 923·6 | 959·9 | 981·0 | 1,036·1 |
| 12· මුළු දළ දේශීය නිෂ්පාදිත .. | 5,930·0 | 6,331·0 | 6,353·2 | 6,549·0 | 6,849·2 | 7,326·2 | 7,392·3 | 7,624·2 | 8,017·0 |
| 13. ශුද්ධ සාධක ආදායම .. | – 36·7 | – 44·2 | – 39·9 | – 46·5 | – 52·5 | – 35·7 | – 15·4 | – 36·8 | – 54·4 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 5,893·3 | 6·286·8 | 6,313·3 | 6,502·5 | 6,796·7 | 7,290·5 | 7,376·9 | 7,587·4 | 7,962·6 |

| | වෙනස් වීමේ සියයට ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1960 / 1959 | 1961 / 1960 | 1962 / 1661 | 1963 / 1962 | 1964 / 1963 | 1965 / 1964 | 1966 / 1965 | 1967 / 1966 |
| 1. කෘෂි කර්මය, දව ඇ වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්ත .. | + 3·8 | + 2·8 | – 2·6 | + 8·7 | + 2·4 | – 5·1 | + 4·1 | + 9·0 |
| 2. පතල් හා ගල් කැඩීම් .. | + 2·9 | – 1·6 | + 5·4 | –10·2 | +10·3 | + 3·0 | + 2·6 | +10·0 |
| 3. නිෂ්පාදනය .. .. | + 4·3 | – 0·3 | + 5·6 | + 4·6 | + 4·6 | + 8·3 | – 4·9 | + 2·4 |
| 4. ගොඩනැංවීම් .. .. | + 0·1 | – 1·4 | + 6·4 | – 3·9 | + 7·3 | – 7·1 | + 1·8 | +16·9 |
| 5. විදුලි ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | + 3·2 | + 6·1 | + 6·7 | + 2·7 | +13·2 | + 4·7 | + 5·9 | + 5·6 |
| 6. ප්‍රවාහණය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | + 8·6 | – 1·4 | + 9·4 | + 0·5 | +10·9 | + 8·0 | + 7·2 | + 2·7 |
| 7. තොග සිල්ලර වෙළෙඳාම .. | +16·9 | – 6·8 | + 9·3 | + 1·8 | +18·1 | + 1·4 | + 4·3 | – 3·6 |
| 8. බැංකු, රක්ෂණ හා අනෙකුත් මූල්‍ය .. | + 1·2 | +13·4 | +10·4 | + 6·2 | +10·8 | +22·8 | – 7·9 | +23·8 |
| 9. නිවාස අයිතිය .. .. | + 6·4 | + 9·2 | + 6·6 | + 4·7 | + 5·8 | + 6·8 | + 6·8 | + 6·8 |
| 10. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. | + 4·5 | + 2·9 | + 6·2 | + 6·2 | – 0·5 | + 2·4 | + 6·6 | + 1·6 |
| 11. සේවා .. .. .. | +10·1 | – 0·2 | + 2·7 | + 1·9 | +10·4 | + 3·9 | + 2·2 | + 5·6 |
| 12· මුළු දළ දේශීය නිෂ්පාදිත .. | + 6·8 | + 0·4 | + 3·1 | + 4·6 | + 7·0 | + 0·9 | + 3·1 | + 5·2 |
| 13. ශුද්ධ සාධක ආදායම .. | | | | | | | | |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | + 6·7 | + 0·4 | + 3·0 | + 4·5 | + 7·3 | + 1·2 | + 2·9 | + 4·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

11 (අ) 2 සංඛ්‍යා සටහනෙන්, දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක වියදම් මිල අනුව, ඇස්තමේන්තු කිරීම දක්වේ. ලංකා ආර්ථික ක්‍රමයේ, විවිධ කාර්මික ක්ෂේත්‍රයන්හි සාපේක්ෂක වැදගත්කම විදහා දක්වීම පිණිස, දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු, කාර්මික මූල කොටස් අනුව දක්වා ඇත.

මුළු දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 35·8 කට වගකිය යුතුවූ, කෘෂිකර්මාන්තයේ, වන කර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ ශුද්ධ නිමැවුම, 1967 දී සියයට 9·0 ක වැඩිවීමක් සටහන් විය. තේ, රබර් සහ පොල්වල හැඩගැස්ම අධෛර්‍යය ගන්වන සුළු විය. තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 3 කින් පහළ වැටුණු අතර, කොළඹ වෙළෙඳ පොළේ රාත්තලක සාමාන්‍ය මිලද සියයට 7 කින් පහළ වැටිණි. රබර් නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 27 කින් වැඩි වූ අතර, කොළඹ වෙළඳ පොළේ ආර්. එස්. එස්. නො: 1 රාත්තලක සාමාන්‍ය මිල සියයට 10 කින් පහළ වැටිණි. පොල් නිෂ්පාදනය සියයට 1·9 කින් පහළ වැටුණු බවට ඇස්තමේන්තු කර ඇති අතර පොල්ගෙඩි සඳහාවූ, නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය මිල සියයට 0·8 කින් පහළ වැටුනේ යයි ඇස්තමේන්තු කර ඇත.මේ අනුව තේ, රබර්, සහ පොල්වල ශුද්ධ නිමැවුම සියයට 2·9 කින් පහළ වැටුණු බව පෙනේ. මෙයට වෙනස් ලෙස දේශීය කෘෂිකර්මාන්තයේ හැඩගැස්ම ධෛර්‍යය ගන්වනසුළු එකක් විය. වී නිෂ්පාදනයේ එකතු වූ වටිනාකම, සියයට 49·9 කින් වැඩි වූ බවට, ඇස්තමේන්තු කර ඇත. මෙයට හේතු වී ඇත්තේ, නිමැවුමේ සහ වී සඳහා වූ, නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය මිලෙහි ද වැඩි වීමය. 1966 දී නිමැවුම බුසල් දශ ලක්ෂ 45·7 සිට 1967 දී බුසල් දශ ලක්ෂ 55·1 දක්වා වැඩිවූයේ යයි අස්තමේන්තු කරඇති අතර, බුසලකට නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය මිල රුපියල් 11·05 සිට රුපියල් 13·61 දක්වා වැඩි විය. ගොඩබාන ලද මාලු ප්‍රමාණය සහ නිෂ්පාදකයින් ලද වැඩි මිලත්, යන දෙකම හේතුකොට ගෙන නැවතත්, ධීවර කර්මාන්තයේ ශුද්ධ නිමැවුම සියයට 28·0 කින් වැඩි විය. පශුධන නිෂ්පාදනවල ශුද්ධ නිමැවුම, එනම් කිරි සහ බිත්තර සියයට 4·5 කින් සහ අතිරේක ආහාර භෝග සියයට 5·3 කින්ද වැඩි වූ බව තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

නිෂ්පාදන කර්මාන්ත වලින් එකතු කළ අගය සියයට 2·4 කින් වැඩි විය. තේ, රබර්, පොල් නිෂ්පාදන වල ශුඞ නිමැවුම සියයට 13·5 කින් අඩු විය. කලින් ඡෙදයේ දී විස්තර කළා සේ තේ, රබර් හා පොල් වල මිළ පිරිහීම හා තේ හා පොල් වල නිපැයුම අඩු වීම මෙයින් නිරූපනය වෙයි. අනෙක් නිෂ්පාදන වලින් එකතු වූ අගය සියයට 0·9 කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, සිමෙන්නි හා සිගරැට් නිමැයුම ඉහළ යාමය. 1967 දී සිමෙන්ති නිෂ්පාදනය ටොන් 81,000 සිට 1,89,000 දක්වා වැඩි වුන අතර, සිගරැට් නිෂ්පාදනය සියයට 10 කින් වැඩි වුයේයැයි ඇස්තමේන්තු කර ඇත.

තැනීමේ කටයුතුවලින් එකතු වූ අගය සියයට 16·9 කින් ඉහළ ගියේය. විශේෂයෙන්ම, තොරතුරු දැන ගන්නට ලැබි ඇති රාජ්‍ය සංස්ථාවල 1967 තැනීම් කටයුතු වල ඉහළ යාමට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ සිමෙන්ති නිෂ්පාදනයේ ඉහළ යෑම විය හැකිය.

බැංකු හා රක්ෂණ කටයුතු වලින් ලැබුන ආදායම සියයට 23·8 කින් ඉහළ ගිය අතර, මෙයද 1967 තුලදී විවෘත කළ ශාඛා ගණන වැඩි වීමෙන් වෙළඳ බැංකු කටයුතු ඉහළ යෑම පෙන්නුම් කරයි. අලුතෙන් විවෘත කළ ශාඛා ගණන 28 ක් වූ අතර, මහජන බැංකුව විසින් විවෘත කළ ග්‍රාමීය ශාඛා බැංකු ගණන 14 කි

## දළ ජාතික වියදම් — පවත්නා වෙළඳ මිල අනුව

සංඛ්‍යා සටහන 11 (අ) 3

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | වෙනසේ සියයට ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1960/1959 | 1961/1960 | 1962/1961 | 1963/1962 | 1964/1963 | 1965/1964 | 1966/1965 | 1967/1966 |
| **1. පෞද්ගලික පාරිභෝජනය** | | | | | | | | | | | | | | | | | |
| (අ) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | | | | | | | | | | | | | | | | | |
| (i) ආහාර සහ අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන .. | 1,812·2 | 1,907·1 | 1,708·7 | 1,740·2 | 1,546·6 | 1,752·6 | 1,609·1 | 1,762·6 | 1,405·2 | + 5·2 | − 10·4 | + 1·8 | − 11·1 | + 13·3 | − 8·2 | + 9·5 | − 20·3 |
| (ii) සාධක නොවන සේවා ආනයන .. | 177·5 | 151·8 | 136·6 | 127·8 | 129·0 | 108·8 | 110·1 | 113·9 | 100·3 | − 14·5 | − 10·0 | − 6·4 | + 0·9 | − 15·7 | + 1·2 | + 3·5 | − 11·9 |
| එකතුව .. .. | 1,989·7 | 2,058·9 | 1,845·3 | 1,868·0 | 1,675·6 | 1,861·4 | 1,719·2 | 1,876·5 | 1,505·5 | + 3·5 | − 10·4 | + 1·2 | − 10·3 | + 11·1 | − 7·7 | + 9·1 | − 19·8 |
| (ආ) මෙරට නිපදවන භාණ්ඩ හා සේවා | | | | | | | | | | | | | | | | | |
| (i) මෙරට නිපදවන භාණ්ඩ .. | 2,026·8 | 2,184·3 | 2,301·7 | 2,384·0 | 2,745·3 | 2,862·3 | 2,889·7 | 3,111·1 | 3,810·9 | + 7·8 | + 5·4 | + 3·6 | + 15·2 | + 4·3 | + 1·0 | + 7·7 | + 22·5 |
| (ii) ගෙවල් කුලී .. .. | 186·3 | 197·3 | 216·4 | 225·7 | 247·3 | 263·7 | 339·9 | 348·9 | 358·0 | + 5·9 | + 9·7 | + 4·3 | + 9·6 | + 6·6 | + 28·9 | + 2·6 | + 2·6 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 240·0 | 255·1 | 271·5 | 287·5 | 293·2 | 337·1 | 373·2 | 400·3 | 428·1 | + 6·3 | + 6·4 | + 5·9 | + 2·0 | + 15·0 | + 10·7 | + 7·3 | + 6·9 |
| (iv) සේවා–අන්තැනක නොසඳහන් .. | 444·1 | 474·8 | 477·3 | 488·6 | 501·0 | 544·8 | 561·3 | 568·8 | 576·2 | + 6·9 | + 0·5 | + 2·4 | + 2·5 | + 8·7 | + 3·0 | + 1·3 | + 1·3 |
| රජයේ මිලට ගැනුම් හැර .. .. | − 109·8 | − 41·2 | − 102·0 | − 132·7 | − 50·0 | − 50·0 | − 55·3 | − 85·0 | − 90·0 | | | | | | | | |
| එකතුව .. .. | 2,787·4 | 3,070·3 | 3,164·9 | 3,253·1 | 3,736·8 | 3,957·9 | 4,108·8 | 4,344·1 | 5,083·2 | + 10·1 | + 3·1 | + 2·8 | + 14·8 | + 5·9 | + 3·8 | + 5 7 | + 17·0 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිලයට ගත් භාණ්ඩ හා සේවා හැර .. .. | − 194·9 | − 168·6 | − 162·3 | − 169·5 | − 170·6 | − 130·4 | − 152·5 | − 166·5 | − 132·9 | | | | | | | | |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය** | **4,582·2** | **4,960·6** | **4,847·9** | **4,951·6** | **5,241·8** | **5,688·9** | 5,675·5 | **6,054·1** | **6,455·8** | **+ 8·3** | − 2·3 | **+ 2·1** | **+ 5·9** | **+ 8·5** | − 0·2 | + 6·7 | + 6·6 |
| **2. රජයේ පාරිභෝජනය** | | | | | | | | | | | | | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම්-මහ ආණ්ඩුව · | 771·4 | 803·2 | 831·3 | 879·7 | 905·8 | 980·0 | 1,043·7 | 1,034·3 | 1,099·3 | + 4·1 | − 3·5 | + 5·8 | + 3·0 | + 8·2 | + 6·5 | − 0·9 | + 6·3 |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම්–පලාත් ආණ්ඩු සභා .. | 90·0 | 86·9 | 73·9 | 78·2 | 82·8 | 87·6 | 90·0 | 100·0 | 105·0 | − 3·4 | − 15·0 | + 5·8 | + 5·9 | + 5·8 | + 2·7 | + 11·1 | + 5·0 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලී .. .. | 19·9 | 20·9 | 21·0 | 21·5 | 22·0 | 22·5 | 23·0 | 24·0 | 24·0 | + 5·0 | + 0·5 | + 2·4 | + 2·3 | + 2·3 | + 2·2 | + 4·3 | ... |
| එකතුව .. .. | 881·3 | 911·0 | 926·2 | 979·4 | 1,010·6 | 1,090·1 | 1,156·7 | 1,158·3 | 1,228·3 | + 3·4 | + 1·7 | + 5·7 | + 3·2 | + 7·9 | + 6·1 | + 0·1 | + 6·0 |
| **3. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය** | | | | | | | | | | | | | | | | | |
| (i) රජයේ .. .. .. | 256·2 | 237·7 | 249·4 | 259·9 | 256·7 | 238·8 | 249·9 | 265·0 | 327·2 | − 7·2 | + 4·9 | + 4·2 | − 1·2 | − 7·0 | + 4·6 | + 6·0 | + 23·5 |
| (ii) රජයේ ව්‍යාපාර .. .. | 79·6 | 79·4 | 91·7 | 103·7 | 127·3 | 101·8 | 129·8 | 123·8 | 114·8 | − 0·3 | + 15·5 | + 13·1 | + 22·8 | − 20·0 | + 27·5 | − 4·6 | − 7·3 |
| (iii) රජයේ සමායතන .. .. | 90·4 | 88·4 | 77·3 | 88·7 | 94·0 | 151·1 | 149·6 | 208·5 } | 814·9 | − 2·2 | − 12·6 | + 14·7 | + 6·0 | + 60·7 | − 1·0 | + 39·4 } | + 11·4 |
| (iv) පෞද්ගලික අංශය .. .. | 691·9 | 616·6 | 619·0 | 648·5 | 617·3 | 627·9 | 501·8 | 522·7 } | | − 10·9 | + 0·4 | + 4·8 | − 4·8 | + 1·7 | − 20·1 | + 4·2 } | |
| එකතුව .. .. | 1,118·1 | 1,022·1 | 1,037·4 | 1,100·8 | 1,095·3 | 1,119·6 | 1,031·1 | 1,120·0 | 1,256·9 | − 8·6 | + 1·5 | + 6·1 | − 0·5 | + 2·2 | − 7·9 | + 8·6 | + 12·2 |
| **4. තොග වෙනස්වීම්** | | | | | | | | | | | | | | | | | |
| (i) රජයේ } .. .. | | | | | | | | | | | | | | | | | |
| (ii) රජයේ ව්‍යාපාර } .. .. | − 21·9 | − 14·4 | + 53·5 | + 39·8 | + 4·7 | − 4·7 | + 23·8 | − 35·5 | + 18·2 | | | | | | | | |
| (iii) රජයේ සමායතන } .. | | | | | | | | | | | | | | | | | |
| (iv) පෞද්ගලික අංශය } .. | + 16·3 | − 30·0 | + 10·6 | − 60·2 | + 60·3 | − 1·8 | − 53·6 | − 26·4 | − 38·4 | | | | | | | | |
| එකතුව .. .. | − 5·6 | − 44·4 | + 64·1 | − 20·4 | + 65·0 | − 6·5 | − 29·8 | − 61·9 | − 20·2 | | | | | | | | |
| **5. දළ දේශීය වියදම්** .. .. | 6,576·0 | 6,849·3 | 6,875·6 | 7,011·4 | 7,412·7 | 7,892·1 | 7,833·5 | 8,270·5 | 8,920·8 | + 4·2 | + 0·4 | + 2·0 | + 5·7 | + 6·5 | − 0·7 | + 5·6 | + 7·9 |
| **6. පිටරට ශුද්ධ ආයෝජන** .. | − 208·0 | − 220·5 | − 93·8 | − 139·7 | − 167·6 | − 160·4 | + 58·9 | − 290·0 | − 328·6 | | | | | | | | |
| **7. ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණ වලින් ලැබීම් (ශුද්ධ) හැර** .. | + 11·6 | − 21·6 | − 10·9 | − 7·1 | − 13·2 | − 40·1 | − 40·7 | − 36·6 | − 22·0 | | | | | | | | |
| 8. දළ ජාතික වියදම .. .. | 6,379·6 | 6,607·2 | 6,770·9 | 6,864·6 | 7,231·9 | 7,691·6 | 7,851·7 | 7,943·9 | 8,570·2 | + 3·6 | + 2·5 | + 1·4 | + 5·4 | + 6·4 | + 2·1 | + 1·2 | + 7·9 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

## දළ ජාතික නිෂ්පාදිත වියදම්

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. දළ ජාතික නිෂ්පාදිතය සාධක මිල අනුව .. | 5,893·3 | 6,286·8 | 6,313·3 | 6,502·5 | 6,796·7 | 7,290·5 | 7,376·9 | 7,587·4 | 7,962·6 |
| 2. අනියම් බදු ආධාර අඩු කොට .. | 383·2 | 407·5 | 384·3 | 490·7 | 485·2 | 484·5 | 529·3 | 629·4 | 828·6 |
| 3. දළ ජාතික නිෂ්පාදිතය වෙළෙඳ මිල අනුව .. | 6,276·5 | 6,694·3 | 6,697·6 | 6,993·2 | 7,281·9 | 7,775·0 | 7,906·2 | 8,216·8 | 8,791·2 |

සංඛ්‍යා සටහන II (අ) 4

## පවත්නා මිල අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4. පාරිභෝගික වියදම පෞද්ගලික .. | 4,582·2 | 4,960·6 | 4,847·9 | 4,951·6 | 5,241·8 | 5,688·9 | 5,675·5 | 6,054·1 | 6,455·8 |
| 5. පාරිභෝජන වියදම් රජයේ.. | 881·3 | 911·0 | 926·2 | 979·4 | 1,010·6 | 1,090·1 | 1,156·7 | 1,158·3 | 1,228·3 |
| 6. දළ දේශිය ප්‍රාග්ධන සම්පාදනය පෞද්ගලික අංශය සහ රජයේ සමායතනය .. | 798·6 | 675·0 | 706·9 | 677·0 | 771·6 | 777·2 | 597·8 | 704·8 | 776·5 |
| 7. දළ දේශිය ප්‍රාග්ධන සම්පාදනය රජයේ හා රජයේ ව්‍යාපාර .. | 313·9 | 302·7 | 394·6 | 403·4 | 388·7 | 335·9 | 403·5 | 353·3 | 460·2 |
| 8. දළ දේශිය වියදම .. | 6,576·0 | 6,849·3 | 6,875·6 | 7,011·4 | 7,412·7 | 7,892·1 | 7·833·5 | 8,270·5 | 8·920·8 |
| 9. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 2,016·0 | 2,010·6 | 1,907·2 | 1,971·0 | 1,902·6 | 1,937·1 | 2,094·5 | 1,864·9 | 1,829·0 |
| 10. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | -2,175·7 | -2,208·5 | -1,972·0 | -2,070·3 | -2,030·9 | -2,101·9 | -2,060·9 | -2,154·7 | -2,125·2 |
| 11. දළ දේශිය නිෂ්පාදිත වියදම වෙළෙඳ මිල අනුව .. | 6,416·3 | 6,651·4 | 6,810·8 | 6,912·1 | 7,284·4 | 7,727·3 | 7,867·1 | 7,980·7 | 8,624·6 |
| 12. පිට රටින් ලැබුන සාධක ආදායම ශුද්ධ | - 36·7 | - 42·2 | - 39·9 | - 46·5 | - 52·5 | - 35·7 | - 15·4 | - 36·8 | - 54·4 |
| 13. ඉතිරි තොග වල නොදත් වෙනස් කම් හා සංඛ්‍යා විෂමතා | - 103·1 | + 87·1 | - 73·3 | + 127·6 | + 50·0 | + 83·4 | + 54·5 | + 272·9 | + 221·0 |
| 14. දළ ජාතික නිෂ්පාදිත වියදම වෙළෙඳ මිල අනුව .. | 6,276·5 | ·6,694·3 | 6,697·6 | 6,993·2 | 7,281·9 | 7,775·0 | 7,906·2 | 8,216·8 | 8,791·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

## සංඛ්‍යා සටහන II (අ) 5

### පෞද්ගලික පාරිභෝජන වියදම් සැකැසුම — පවත්නා වෙළෙඳ මිල අනුව.

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **අ. භාණ්ඩ හා සාධක නොවන සේවා** | | | | | | | | | |
| (1) සහල්, තිරිඟු පිටි සහ සීනි .. | 484·5 | 482·2 | 513·2 | 534·0 | 516·9 | 516·7 | 598·0 | 600·8 | 586·1 |
| (2) අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ .. .. | 1,327·7 | 1,424·9 | 1,195·5 | 1,206·2 | 1,029·7 | 1,235·9 | 1,011·1 | 1,161·8 | 819·1 |
| සාධක නොවන සේවා .. | 177·5 | 151·8 | 136·6 | 127·8 | 129·0 | 108·8 | 110·1 | 113·9 | 100·3 |
| එකතුව .. .. | 1,989·7 | 2,058·9 | 1,845·3 | 1,868·0 | 1,675·6 | 1,861·4 | 1,719·2 | 1,876·5 | 1,505·5 |
| **ආ. මෙරට නිපදවුනු භාණ්ඩ හා සේවා** | | | | | | | | | |
| (1) මෙරට නිපදවුනු භාණ්ඩ .. | | | | | | | | | |
| සහල් .. .. | 312·2 | 307·5 | 274·9 | 305·6 | 319·1 | 318·3 | 235·9 | 278·6 | 631·4 |
| පොල් නිෂ්පාදිත .. ,. | 231·9 | 187·0 | 162·0 | 154·3 | 209·5 | 217·3 | 275·5 | 278·7 | 292·9 |
| තේ .. .. | 62·7 | 67·4 | 68·9 | 70·1 | 78·2 | 78·6 | 77·5 | 78·5 | 75·9 |
| අනෙකුත් ආහාර බෝග .. | 357·3 | 414·5 | 477·8 | 442·3 | 458·8 | 497·5 | 489·1 | 507·5 | 516·9 |
| දුම්කොළ .. .. | 19·5 | 21·7 | 26·9 | 30·6 | 31·5 | 32·3 | 33·0 | 33·8 | 50·4 |
| බුලත්, පුවක් .. .. | 81·0 | 86·9 | 88·3 | 80·9 | 84·6 | 78·5 | 70·8 | 68·0 | 71·0 |
| දර .. .. | 70·6 | 73·0 | 76·0 | 77·9 | 79·7 | 81·8 | 82·6 | 83·7 | 85·6 |
| පශු සම්පත .. .. | 124·2 | 122·7 | 137·2 | 133·2 | 172·4 | 182·8 | 189·8 | 198·0 | 270·1 |
| මාළු .. .. | 78·3 | 102·6 | 144·9 | 176·8 | 181·4 | 191·0 | 191·8 | 210·3 | 319·3 |
| කාර්මික නිෂ්පාදිත .. .. | 689·1 | 801·0 | 844·8 | 912·3 | 1,130·1 | 1,184·2 | 1,243·7 | 1,374·0 | 1,497·4 |
| එකතුව .. .. | 2,026·8 | 2,184·3 | 2,301·7 | 2,384·0 | 2,745·3 | 2,862·3 | 2,889·7 | 3,111·1 | 3,810·9 |
| (2) ගෙවල් කුලී .. .. | 186·3 | 197·3 | 216·4 | 225·7 | 247·3 | 263·7 | 339·9 | 348·9 | 358·0 |
| (3) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 240·0 | 255·1 | 271·5 | 287·5 | 293·2 | 337·1 | 373·2 | 400·3 | 428·1 |
| (4) සේවා (අන් තැනක නොසඳහන්) | | | | | | | | | |
| පුද්ගලයන්ට කරන ලද මූල්‍ය සේවා .. | 12·9 | 14·0 | 15·0 | 16·2 | 17·9 | 19·3 | 21·1 | 22·3 | 23·6 |
| ක්‍රීඩා සහ විනෝද .. .. | 24·4 | 25·2 | 26·0 | 26·7 | 27·5 | 28·6 | 29·7 | 30·0 | 27·8 |
| ගෘහ සේවා .. .. | 200·1 | 203·1 | 209·4 | 217·8 | 226·6 | 237·3 | 243·8 | 249·1 | 255·8 |
| හෝටල් සහ ආපන ශාලා .. | 119·2 | 121·0 | 124·7 | 129·7 | 134·5 | 141·2 | 145·0 | 148·3 | 151·7 |
| වෘත්තීය සහ ආයතන සේවා (අන් තැනක නොසඳහන්) .. | 37·6 | 60·9 | 50·0 | 43·9 | 37·8 | 59·6 | 60·3 | 56·1 | 52·2 |
| පෞද්ගලික සේවා (අන් තැනක නොසඳහන්) .. .. | 49·9 | 50·6 | 52·2 | 54·3 | 56·5 | 58·8 | 61·0 | 63·0 | 65·1 |
| එකතුව .. .. | 444·1 | 474·8 | 477·3 | 488·6 | 501·0 | 544·8 | 561·3 | 568·8 | 576·2 |
| රජයේ දේශීය මිල දී ගැනීම් හැර .. | − 109·8 | − 41·2 | − 102·0 | − 132·7 | − 50·0 | − 50·0 | − 55·3 | − 85·0 | − 90·0 |
| **මුළු එකතුව** .. | 2,787·4 | 3,070·3 | 3,164·9 | 3,253·1 | 3,736·8 | 3,957·9 | 4,108·8 | 4,344·1 | 5,083·2 |
| **අනේවාසිකයන් විසින් මිල දී ගත් භාණ්ඩ හා සේවා හැර** .. | − 194·9 | − 168·6 | − 162·3 | − 169·5 | − 170·6 | − 130·4 | − 152·5 | − 166·5 | − 132·9 |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය** | 4,582·2 | 4,960·6 | 4,847·9 | 4,951·6 | 5,241·8 | 5,688·9 | 5,675·5 | 6,054·1 | 6,455·8 |

වෙනසෙහි සියයට ගණන

| | 1960/1959 | 1961/1960 | 1962/1961 | 1963/1962 | 1964/1963 | 1965/1964 | 1966/1965 | 1967/1966 |
|---|---|---|---|---|---|---|---|---|
| **අ. භාණ්ඩ හා සාධක නොවන සේවා** | | | | | | | | |
| (1) සහල්, තිරිඟු පිටි සහ සීනි .. | − 0·5 | + 6·4 | + 4·1 | − 3·2 | ... | +15·7 | + 0·5 | − 2·4 |
| (2) අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ .. .. | + 7·3 | − 16·1 | + 0·9 | − 14·6 | + 20·0 | − 18·2 | + 14·9 | − 29·5 |
| සාධක නොවන සේවා .. | − 14·5 | − 10·0 | − 6·4 | + 0·9 | − 15·7 | + 1·2 | + 3·5 | − 11·9 |
| එකතුව .. .. | + 3·5 | − 10·4 | + 1·2 | − 10·3 | + 11·1 | − 7·6 | + 9·1 | − 19·8 |
| **ආ. මෙරට නිපදවුනු භාණ්ඩ හා සේවා** | | | | | | | | |
| (1) මෙරට නිපදවුනු භාණ්ඩ .. | | | | | | | | |
| සහල් .. .. | − 1·5 | − 10·6 | + 11·2 | + 4·4 | − 0·3 | − 25·9 | + 18·1 | + 126·6 |
| පොල් නිෂ්පාදිත .. ,. | − 19·4 | − 13·4 | − 4·8 | + 35·8 | + 3·7 | + 26·8 | + 1·2 | + 5·1 |
| තේ .. .. | + 7·5 | + 2·2 | + 1·7 | + 11·6 | + 0·5 | − 1·4 | + 1·3 | − 3·3 |
| අනෙකුත් ආහාර බෝග .. | + 16·0 | + 15·3 | − 7·4 | + 3·7 | + 8·4 | − 1·7 | + 3·8 | + 1·9 |
| දුම්කොළ .. .. | + 11·3 | + 24·0 | + 13·8 | + 2·9 | + 2·5 | + 2·2 | + 2·4 | + 49·1 |
| බුලත්, පුවක් .. .. | + 7·3 | + 1·6 | − 8·4 | + 4·6 | − 7·2 | − 9·8 | − 4·0 | + 4·4 |
| දර .. .. | + 3·4 | + 4·1 | + 2·5 | + 2·3 | + 2·6 | + 1·0 | + 1·3 | + 2·3 |
| පශු සම්පත .. .. | − 1·2 | + 11·8 | − 2·9 | + 29·4 | + 6·0 | + 3·8 | + 4·3 | + 36·4 |
| මාළු .. .. | + 31·0 | + 41·2 | + 22·0 | + 2·6 | + 5·3 | + 0·4 | + 9·6 | + 51·8 |
| කාර්මික නිෂ්පාදිත .. .. | + 16·2 | + 5·5 | + 8·0 | + 23·9 | + 4·8 | + 5·0 | + 10·5 | + 9·0 |
| එකතුව .. .. | + 7·8 | + 5·4 | + 3·6 | + 15·2 | + 4·3 | + 1·0 | + 7·7 | + 22·5 |
| (2) ගෙවල් කුලී .. .. | + 5·9 | + 9·7 | + 4·3 | + 9·6 | + 6·6 | + 28·9 | + 2·6 | + 2·6 |
| (3) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | + 6·3 | + 6·4 | + 5·9 | + 2·0 | + 15·0 | + 10·7 | + 7·3 | + 6·9 |
| (4) සේවා (අන් තැනක නොසඳහන්) | | | | | | | | |
| පුද්ගලයන්ට කරන ලද මූල්‍ය සේවා .. | + 8·5 | + 7·1 | + 8·0 | + 10·5 | + 7·8 | + 9·3 | + 5·7 | + 5·7 |
| ක්‍රීඩා සහ විනෝද .. .. | + 3·3 | + 3·2 | + 2·7 | + 3·0 | + 4·0 | + 3·8 | + 1·0 | − 7·3 |
| ගෘහ සේවා .. .. | + 1·5 | + 3·1 | + 4·0 | + 4·0 | + 4·7 | + 2·7 | + 2·7 | + 2·7 |
| හෝටල් සහ ආපන ශාලා .. | + 1·5 | + 3·1 | + 4·0 | + 3·7 | + 5·0 | + 2·7 | + 2·3 | + 2·3 |
| වෘත්තීය සහ ආයතන සේවා (අන් තැනක නොසඳහන්) .. | + 62·0 | − 17·9 | − 12·2 | − 13·9 | + 57·7 | + 1·2 | − 7·0 | − 7·0 |
| පෞද්ගලික සේවා (අන් තැනක නොසඳහන්) .. .. | + 1·4 | + 3·2 | + 4·0 | + 4,1 | + 4·1 | + 3·7 | + 3·3 | + 3·3 |
| එකතුව .. .. | + 6·9 | + 0·5 | + 2·4 | + 2·5 | + 8·7 | + 3·0 | + 1·3 | + 1·3 |
| රජයේ දේශීය මිල දී ගැනීම් හැර .. | | | | | | | | |
| **මුළු එකතුව** .. | + 10·1 | + 3·1 | + 2·8 | + 14·9 | + 5·9 | + 3·8 | + 5·7 | + 17·0 |
| **අනේවාසිකයන් විසින් මිල දී ගත් භාණ්ඩ හා සේවා හැර** .. | | | | | | | | |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය** | + 8·3 | − 2·3 | + 2·1 | + 5·9 | + 8·5 | − 0·2 | + 6·7 | + 6·6 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය පරිපාලනයෙන් එකතු කළ අගයද සියයට 5·6 කින් ඉහළ ගියේය. සෞඛ්‍යය, අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සේවා මගින් එකතු කළ අගය, සියයට 5·6 කින් ඉහළ ගියේය. සෞඛ්‍ය හා අධ්‍යාපන දෙපාර්තමේන්තු වල පෞද්ගලික ආදායම්, ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 21·7 කින් ඉහළ ගියේය. 1967 දී දේශීය දළ නිෂ්පාදිතය සියයට 5·2 කින් ඉහළ ගියේයයි ඇස්තමේන්තු කර ඇත. විදේශ වලින් ලැබුන ආදායම් අංශයෙහි 1966 වර්ෂයේදී පැවති රුපියල් දශ ලක්ෂ 36·8, පිටතට ගලා යාම හා සසඳන කල, මේ වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 54·7 තරම් විශාල මුදලක් පිටතට ගලා යාම සිදු වූ හෙයින් දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම සියයට 0·4 ක් විය. මෙය දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීමට වඩා අඩු විය.

සංඛ්‍යා සටහන II (අ) 3 වෙළෙඳ පොළේ පවත්නා මිල අනුව, දළ දේශීය වියදම පිළිබඳ ඇස්තමේන්තුව දක්වයි. දළ දේශීය නිෂ්පාදිතයට, වක්‍ර බදු වලින් ලබා ගත් විකල්ප දළ ජාතික වියදම් ඇස්තමේන්තුවක් II (අ) 4 වන සංඛ්‍යා සටහනින් දක්වෙයි. 1967 දී දළ ජාතික වියදම, වෙළෙඳ මිල අනුව සියයට 7·9 ක වැඩිවීමක් දක්විය. මෙය 1966 දී සියයට 1·2 ක් විය. 1967 දී මෙසේ ඉහළ යාමට හේතු වූයේ පෞද්ගලික හා පොදු අංශ පාරිභෝජන පැහැදම වැඩි කිරීම හා දළ ප්‍රාග්ධන සම්පාදනය පුළුල් කිරීම නිසාය පෞද්ගලික පාරිභෝජන වියදම් සියයට 6·6 කින් වැඩිවුන අතර 1966 දී වූ වැඩි වීම වන සියයට 6·7 හා සැසඳේ. පොදු පාරිභෝජනය ඉකුත් වර්ෂයේ දී සියයට 0·1 කින් පමණක් ඉහළ ගියත්, 1967 දී සියයට 6·0 කින් ඉහළ ගියේය. මුළු ප්‍රාග්ධන සම්පාදනය සියයට 16·9 කින් වැඩිවිය. රාජ්‍ය සංස්ථා ඇතුළු පෞද්ගලික අංශයේ මෙම ඉහළ යාම සිදුවිය.

පෞද්ගලික පාරිභෝජනය පිළිබඳ විස්තර II (අ) 5 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1966 දී භාණ්ඩ හා සාධක නොවන සේවාවල සියයට 9·1 කින් ඉහළ ගියත්, එයට වෙනස් ලෙස 1967 දී ආනයන සඳහා කළ වියදම් සියයට 19·8 කින් පහළ ගියේය. සහල්, පිටි, සීනි, ආනයන වෙනුවෙන් කළ වියදම් සියයට 2·4 කින් පහළ ගියේය. ඒ අතර පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයනය කිරීමට කල වියදම් සියයට 29·5 කින් අඩු විය. ආනයන කළ භාණ්ඩ වෙනුවෙන් කළ වියදම් පහළ යෑම දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ වෙනුවෙන් කළ වියදම් වල සිදුවූ ඉතා කැපී පෙනෙන ඉහළ යෑම නිසා වුවමනා වටත් වඩා හිලව් වී ගියේය. මෙම භාණ්ඩ වලට කළ වියදම සියයට 22·5 කින් වැඩි විය. දේශීය වශයෙන් නිපද වු සහල් සඳහා වියදම රුපියල් දශලක්ෂ 279 සිට රුපියල් දශලක්ෂ 631 දක්වා ඉහළ ගියේයයි ඇස්තමේන්තු කර ඇත. මෙය විවෘත වෙළෙඳ පොළේ සහල් මිල ඉහළ යැමත්, විවෘත වෙළෙඳ පොළේදී විශාල ප්‍රමාණයක් වී විකිණීමත් නිරූපනය කරයි. දෙවනුව කී තත්ත්වය ඇති වූයේ 1966 දෙසැම්බරයේදී රජය, සලාකයට විකුණන සහල් අඩු කිරීමත්, දේශිය, වී නිෂ්පාදනය ඉහළ යාමත් නිසාය. අනෙක් භාණ්ඩ හා සේවා වෙනුවෙන් කල වියදම් ඉහළ ගියේ නිෂ්පාදනය කළ ප්‍රමාණයේ හා සිල්ලර මිලෙහි ඉහළ යෑම නිසාය. මාළු හා සත්ව ද්‍රව්‍යවලට කළ වියදමද පැහැදිලිව ඉහළ යනු පෙනුණි. මගීන්ගේ ප්‍රවාහන වියදම්, විශේෂයෙන් බස් ගමන් සියයට 6·9 කින් වැඩි විය. ලංකා ගමනාගමන මණ්ඩලයට මගීන්ගෙන් හා ගමන් බඩු වලින් ලැබුණු ආදායම, 1966 පැවැති රුපියල් දශ ලක්ෂ 217·6 සිට 1967 දී රුපියල් දශ ලක්ෂ 242·3 දක්වා ඉහළ ගියේය. බස් ධාවනය කළ සැතපුම් ගණනද දශ ලක්ෂ 184 සිට දශ ලක්ෂ 208 දක්වා වැඩි විය.

පවත්නා වෙළඳ මිල අනුව, ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ විස්තර II (අ) 6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1967 දී දළ ප්‍රාග්ධන සම්පාදනය සියයට 16·9 කින් වැඩිවිය. මෙය 1966 දී සිදුවූ සියයට 5·7 ක ප්‍රමාණය හා සැසඳේ. 1967 දී දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 12·2 ක වැඩිවීමක් පෙන්විය. පෞද්ගලික හා රාජ්‍ය සංස්ථාවල

## සංඛ්‍යා සටහන II (අ) 6

## දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය – පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | වෙනසේ සියයට ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1960 / 1959 | 1961 / 1960 | 1962 / 1961 | 1963 / 1962 | 1964 / 1963 | 1965 / 1964 | 1966 / 1965 | 1967 / 1966 |
| **අ. පෞද්ගලික අංශය සහ රජයේ සමායතන** | | | | | | | | | | | | | | | | | |
| (i) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පෞද්ගලික අංශය හා රජයේ සමායතන | | | | | | | | | | | | | | | | | |
| වගා කිරීම, නැවත වගා කිරීම සහ ඉඩම් සංවර්ධනය .. | 62·1 | 63·2 | 63·2 | 64·0 | 69·5 | 87·2 | 69·1 | 68·7 | 67·1 | + 1·8 | .... | + 1·3 | + 8·6 | +25·5 | −20·8 | − 0·6 | − 2·3 |
| ගොඩනැංවීම, වෙනත් විශේෂිත ඉදිරි කිරීම .. .. | 384·2 | 396·1 | 387·2 | 405·0 | 362·2 | 409·1 | 375·9 | 370·3 | 431·4 | + 3·1 | − 2·3 | + 4·6 | −10·6 | +12·9 | − 8·1 | − 1·5 | +16.5 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ .. | 116·8 | 74·8 | 112·0 | 114·3 | 155·7 | 174·5 | 112·1 | 137·4 | 154·1 | −36·0 | +49·7 | + 2·1 | +36·2 | +12·1 | −35·8 | +22·6 | +12·2 |
| ප්‍රවාහන යන්ත්‍රෝපකරණ .. | 152·5 | 108·7 | 85·0 | 91·9 | 62·8 | 50·1 | 62·7 | 98·0 | 79·7 | −28·7 | −21·8 | + 8·1 | −31·7 | −20·2 | +25·1 | +56·3 | −18·7 |
| ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ (අන්තැනෙක නොසඳහන්) .. | 66·7 | 62·2 | 60·3 | 62·0 | 61·1 | 58·1 | 31·6 | 56·8 | 82·6 | − 6·8 | − 3·1 | + 2·8 | − 1·5 | − 4·9 | −45·6 | +79·7 | +45·4 |
| එකතුව .. | 782·3 | 705·0 | 707·7 | 737·2 | 711·3 | 779·0 | 651·4 | 731·2 | 814·9 | − 9·9 | + 0·2 | + 4·2 | − 3·5 | + 9·5 | −16·4 | +12·3 | +11·4 |
| පෞද්ගලික අංශය .. | 691·9 | 616·6 | 619·0 | 648·5 | 617·3 | 627·9 | 501·8 | 522·7 | 814·9 | −10·9 | + 0·4 | + 4·8 | − 4·8 | + 1·7 | −20·1 | + 4·2 | +11·4 |
| රජයේ සමායතන .. | 90·4 | 88·4 | 77·3 | 88·7 | 94·0 | 151·1 | 149·6 | 208·5 | | − 2·2 | −12·6 | +14·7 | + 6·0 | +60·7 | − 1·0 | +39·4 | |
| (ii) තොග වෙනස්වීම | | | | | | | | | | | | | | | | | |
| තේ .. .. | + 1·0 | − 12·5 | − 3·1 | − 37·1 | − 16·9 | − 23·5 | − 64·1 | +21·6 | − 24·4 | | | | | | | | |
| රබර් .. .. | − 2·5 | − 26·8 | + 18·6 | + 2·9 | + 20·3 | − 12·2 | − 10·7 | −14·7 | + 10·3 | | | | | | | | |
| පොල් තෙල් .. | .... | .... | .... | .... | .... | − 4·2 | + 10·3 | + 2·0 | ල. නො. | | | | | | | | |
| පශු සම්පත .. | + 17·8 | + 9·3 | − 4·9 | − 26·0 | + 56·9 | + 38·1 | + 10·9 | −35·3 | − 24·3 | | | | | | | | |
| එකතුව .. | + 16·3 | − 30·0 | + 10·6 | − 60·0 | + 60·3 | − 1·8 | − 53·6 | −26·4 | − 38·4 | | | | | | | | |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය · | 798·6 | 675·0 | 718·3 | 677·2 | 771·6 | 777·2 | 597·8 | 704·8 | 776·5 | −15·5 | + 6·4 | − 5·7 | +13·9 | + 0·7 | −23·1 | +17·9 | +10·2 |
| **ආ. රජයේ හා රජයේ සමායතන** | | | | | | | | | | | | | | | | | |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 335·8 | 317·1 | 341·1 | 363·6 | 384·0 | 340·6 | 379·7 | 388·8 | 442·0 | − 5·6 | + 7·6 | + 6·6 | + 5·6 | −11·3 | +11·5 | + 2·4 | +13·7 |
| තොග වෙනස්වීම | | | | | | | | | | | | | | | | | |
| ආනයන කළ සහල්, තිරිඟු පිටි සහ සීනි .. | + 13·0 | − 26·3 | − 12·1 | − 2·0 | + 0·1 | − 4·7 | + 22·0 | − 37·6 | ල. නො. | | | | | | | | |
| සහතික මිලට ගත් වී .. | − 34·8 | + 9·7 | + 65·3 | + 45·1 | + 9·6 | | | | + 18·2 | | | | | | | | |
| අරක්කු .. | − 0·1 | + 2·2 | + 0·3 | − 3·3 | − 5·0 | .... | + 1·8 | + 2·1 | ල. නො. | | | | | | | | |
| එකතුව .. | − 21·9 | − 14·4 | + 53·5 | + 39·8 | + 4·7 | − 4·7 | + 23·8 | −35·5 | + 18·2 | | | | | | | | |
| **ඇ. සියලුම අංශ** | | | | | | | | | | | | | | | | | |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 1,118·1 | 1,022·1 | 1,037·4 | 1,100·8 | 1,095·3 | 1,119·6 | 1,031·1 | 1,120·0 | 1,256·9 | − 8·6 | + 1·5 | + 6·1 | − 0·5 | + 2·2 | − 7·9 | + 8·6 | +12·2 |
| තොග වෙනස්වීම් .. | − 5·6 | − 44·4 | + 64·1 | − 20·4 | + 65·0 | − 6·5 | − 29·8 | −61·9 | − 20·2 | | | | | | | | |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය · | 1,112·5 | 977·7 | 1,101·5 | 1,080·4 | 1,160·3 | 1,113·1 | 1,001·3 | 1,058·1 | 1,236·7 | −12·1 | +12·7 | − 1·9 | + 7·4 | − 4·1 | −10·0 | + 5·7 | +16·9 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ඇ) 7

## සම්පත් මාර්ග සහ ඒ උපයෝගී කර ගැනීම — පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | වෙනයේ සියයට ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1960/1959 | 1961/1960 | 1962/1961 | 1963/1962 | 1964/1963 | 1965/1964 | 1966/1965 | 1967/1966 |
| අ. සම්පත් මාර්ග .. .. | | | | | | | | | | | | | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය .. | 6,416·3 | 6,651·4 | 6,810·8 | 6,912·1 | 7,284·4 | 7,727·3 | 7,867·1 | 7,980·7 | 8,624·9 | + 3·7 | + 2·4 | + 1·5 | + 5·4 | + 6·1 | + 1·8 | + 1·4 | + 8·0 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. | 2,175·7 | 2,208·5 | 1,972·0 | 2,070·3 | 2,030·9 | 2,101·9 | 2,060·9 | 2,154·7 | 2,125·2 | + 1·5 | —10·7 | + 5·0 | — 1·9 | + 3·5 | — 2·0 | + 4·6 | – 1·4 |
| එකතුව .. .. .. | **8,592·0** | **8,859·9** | **8,782·8** | **8,982·4** | **9,315·3** | **9,829·2** | **9,928·0** | **10,135·4** | **10,749·8** | + 3·1 | — 0·9 | + 2·3 | + 3·7 | + 5·5 | + 1·0 | + 2·1 | + 6·0 |
| ආ. උපයෝගී කර ගැනීම | | | | | | | | | | | | | | | | | |
| පාරිභෝජනය .. .. | 5,463,5 | 5,871·6 | 5,774·1 | 5,931·0 | 6,252·4 | 6,779·0 | 6,832 2 | 7,212·4 | 7,684·1 | + 7·5 | — 1·7 | + 2·7 | + 5·4 | + 8·4 | + 0·8 | + 5·6 | + 6·5 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 1,112·5 | 977·7 | 1,101·5 | 1,080·4 | 1,160·3 | 1,113·1 | 1,001·3 | 1,058·1 | 1,236·7 | —12·1 | +12·7 | — 1·9 | + 7·4 | — 4·1 | —10·0 | + 5·7 | +16·9 |
| භාණ්ඩ සහ සාධක නොවනසේවා අපනයන .. | 2,016·0 | 2,010·6 | 1,907·2 | 1,971,0 | 1,902·6 | 1,937·1 | 2,094·5 | 1,864·9 | 1,829·0 | – 0·3 | — 5·1 | + 3·3 | — 3·5 | + 1·8 | + 8·1 | —11·0 | — 2·0 |
| එකතුව .. .. .. | **8·592·0** | **8,859·9** | **8,782·8** | **8,982·4** | **9,315·3** | **9,829·2** | **9,928·0** | **10,135·4** | **10,749·8** | + 3·1 | — 0·9 | + 2·3 | + 3·7 | + 5·5 | + 1·0 | + 2.1 | + 6·0 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (අ) 8

### දළ දේශීය වියදම සහ තිබෙන සම්පත් මාර්ග පවත්නා වෙළෙඳ මිල අනුව

| | 1959 | | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | | 1965 | | 1966 | | 1967 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ ශීර්ෂයට ශතක | රුපියල් දශ ලක්ෂ | 4 වැනි පෙළේ ශීර්ෂයට ශතක |
| 1· පාරිභෝජන වියදම: පෞද්ගලික .. | 4,582·2 | 71·8 | 4,960·6 | 75·1 | 4,847·9 | 71·6 | 4,951·6 | 72·1 | 5,241·8 | 72·5 | 5,688·9 | 74·0 | 5,675·5 | 72·3 | 6,054·1 | 76·2 | 6,455·8 | 75·3 |
| 2· පාරිභෝජන වියදම: රජයේ .. | 881·3 | 13·8 | 911·0 | 13·8 | 926·2 | 13·7 | 979·4 | 14·3 | 1,010·6 | 14·0 | 1,090·1 | 14·2 | 1,156·7 | 14·7 | 1,158·3 | 14·6 | 1,228·3 | 14·3 |
| 3· දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය; පෞද්ගලික අංශය හා රජයේ සමායතන: .. | 798·6 | 12·5 | 675·0 | 10·2 | 706·9 | 10·4 | 677·0 | 9·9 | 771·6 | 10·7 | 777·2 | 10·1 | 597·8 | 7·6 | 704·8 | 8·9 | 776·5 | 9·1 |
| 4· දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය: රජයේ ව්‍යාපාර<br>5· දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රජයේ | 313·9 | 4·9 | 302·7 | 4·6 | 394·6 | 5·8 | 403·4 | 5·9 | 388·7 | 5·4 | 335·9 | 4·4 | 403·5 | 5·1 | 353·3 | 4·4 | 460·2 | 5·4 |
| 6· දළ දේශීය වියදම් .. | 6,576·0 | 103·1 | 6,849·3 | 103·7 | 6,875·6 | 101·5 | 7,011·4 | 102·1 | 7,412·7 | 102·5 | 7,892·1 | 102·6 | 7,833·5 | 99·8 | 8,270·5 | 104·1 | 8,920·8 | 104·1 |
| 7· දළ ජාතික නිෂ්පාදනය (ගලපා) .. | 6,379·6 | 100 | 6,607·2 | 100 | 6,770·9 | 100 | 6,865·6 | 100 | 7,231·9 | 100 | 7,691·6 | 100 | 7,851·7 | 100 | 7,943·9 | 100 | 8,568·2 | 100 |
| 8· ශීර්ෂ (6) ශීර්ෂ (7) ට වැඩි කොටස ලැබුනේ | | | | | | | | | | | | | | | | | | |
| (අ) පිටරට අනායෝජන (ශුද්ධ) .. | + 208·0 | | + 220·5 | | + 93·8 | | + 139·7 | | + 167·6 | | + 160·4 | | — 58·9 | | + 290·0 | | + 328·6 | |
| (ආ) ජාත්‍යන්තර ත්‍යාග හා ප්‍රේෂණ ලැබීමෙන් ශුද්ධ .. | — 11·6 | | + 21·6 | | + 10·9 | | + 7·1 | | + 13·2 | | + 40·1 | | + 40·7 | | + 36·6 | | + 22·0 | |
| (අ) + (ආ) .. | + 196·4 | | + 242·1 | | + 104·7 | | + 146·8 | | + 180·8 | | + 200·5 | | — 18·2 | | . 326·6 | | + 350·6 | |

විස්තර සටහන් සඳහා 42 පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 11·4 කින් වැඩිවිය. ගොඩනැගිලි තැනීමේ කර්මාන්තයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට 16·5 කින් වැඩිවිය. මෙය 1967 දී ගොඩනැගිලි උපකරණ වැඩිපුර ප්‍රමාණයක් ලබාගත හැකිවීම නිරූපනය කරයි.

කලින්ද සඳහන් කළ අයුරු, සිමෙන්ති නිෂ්පාදනය ටොන් 81,000 සිට ටොන් 1,89,000 දක්වා වැඩිවුන අතර, සිමෙන්ති අලෙවිය ටොන් 75,000 සිට ටොන් 1,92,000 දක්වා වැඩි විය. ආනයන කළ යන්ත්‍ර උපකරණ වල ප්‍රාග්ධන සම්පාදනය සියයට 12·2 කින් ඉහළ ගිය අතර, ප්‍රවාහන උපකරණවල ප්‍රාග්ධන සම්පාදනය, සියයට 18·7 කින් පහළ ගියේය. කෙසේ වෙතත්, අනෙක් ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩවලට කළ වියදම සියයට 45·4 කින් 1967 දී ඉහළ ගියේය.

රාජ්‍ය අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයද සියයට 13·7 කින් වැඩිවිය. මෙය 1967 දී වාරිමාර්ග ඉඩම් සංවර්ධන හා පොදු වැඩ සම්බන්ධයෙන් කළ වියදම් ඉහළ යෑම පෙන්වයි.

**ලබාගත හැකි සම්පත් හා ඒවා උපයෝගී කොටගත් අයුරු.**

II (අ) 7 සංඛ්‍යා සටහන, නිෂ්පාදනය හා ආනයන කිරීම මගින්, ලබාගත හැකි වූ මුළු සම්පත් ප්‍රමාණය දක්වයි. 1967 දී ලබාගත හැකිවූ සම්පත් සියයට 8 කින් වැඩි විය. 1966 මෙන් නොව, සම්පත්වල පුළුල්වීම මුළුමනින්ම පාහේ සිදුවූයේ දේශීය නිෂ්පාදනය වැඩිවීමෙනි. ආනයන සියයට 1·4 කින් අඩුවිය. මෙම තත්ත්වය මුළු සම්පත් ප්‍රමාණයේ දළ දේශීය නිෂ්පාදනයේ කොටස, 1966 දී පැවැති සියයට 78·7 සිට සියයට 80·2 දක්වා 1967 දී වැඩිකිරීමටත්, ඒ අනුව ආනයන ප්‍රමාණය සියයට 21·3 සිට 19·8 දක්වා අඩු කිරීමටත් තුඩු දුනි.

II (අ) 7 සංඛ්‍යා සටහන මගින් සම්පත් උපයෝගී කොට ගැනීමේ රටාවද පෙන්නුම් කෙරේ. 1967 දී පාරිභෝජනය සඳහා ප්‍රයෝජනයට ගත් සම්පත් ප්‍රමාණය සියයට 6·5 කින් ඉහළ ගිය අතර 1966 දී මෙම ඉහළ යාම සියයට 5·6 ක් විය. 1966 දී සියයට 5·7 කින් වැඩි වූ ප්‍රාග්ධන සම්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත් සම්පත් ප්‍රමාණය 1967 දී සියයට 16·9 කින් ඉහළ ගියේ ය. මුළු සම්පත් ප්‍රමාණ-යෙන් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත් සම්පත් අනුපාතයෙහිද 1967 දී වැඩිවීමක් පෙන්විය. 1966 දී සියයට 10·4 ක්ව පැවති මෙම අනුපාතය 1967 දී සියයට 11·5 දක්වා ඉහළ ගියේය.

II (අ) 8 සංඛ්‍යා සටහන, දළ දේශීය වියදමේ සංඛ්‍යා වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ සංඛ්‍යා සමග සංසන්දනය කරයි. කලින් වාර්තා මගින් අප පෙන්වා දුන් පරිදි, මෑත අවුරුදු වලදී, නොකඩවා පැවැති ලක්ෂණයක් වූයේ, දළ දේශීය වියදම අනුව මිනුම් කළ මුළු ඉල්ලුමට වඩා, දේශීය නිෂ්පාදිතයෙන් ලබාගත හැකි සම්පත් ප්‍රමාණය අඩු වීමයි. උදාහරණයක් වශයෙන් 1959 දී, දළ ජාතිය නිෂ්පාදිතය වෙනුවෙන් පැවැති දළ දේශීය වියදම් අනුපාතය, සියයට 103·1 ක් විය. උච්චාවචන වලින් පසු, 1967 දී මෙම අනුපාතය සියයට 104·1 දක්වා ඉහළ ගියේය.

1967 තේ අනුපාතය, 1966 පැවැති සියයට 104·1 මට්ටමේම පැවතුනි. 1967 දක්නට තිබුණු පහල වැටීම, ජාත්‍යාන්තර ණය ගැති බව රුපියල් 329 කින් සහ ජාත්‍යාන්තර තිළින සහ පැවරීම්හි ශුද්ධ ලැබීම්, රුපියල් දශ ලක්ෂ 22 කින් ඉහල යාමෙන් සමනය විය.

පොදු පාරිභෝජනය, පෞද්ගලික පාරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනයෙහි ඇති ඍජු ආනයන කොටසෙහි ඇස්තමේන්තු, II (අ) 9 වැනි සංඛ්‍යා සටහනින් පෙන්වාදී ඇත. දේශීය වශයෙන් නිෂ්පාදනයවූ භාණ්ඩ, වැඩියෙන් තිබීම සහ ආනයනයන් වල පහල වැටීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝජන සහ ප්‍රාග්ධන සම්පාදනයෙහිවූ ඍජු ආනයන කොටස සාමාන්‍ය වශයෙන් අඩුවිය. පෞද්ගලික පාරිභෝජනයෙහි මි. ර. ගැ. මිල අනුව මිණුන ආනයන කොටස, 1966 පැවැති සියයට 21·6, 1967දී සියයට 15·6 දක්වා පහළ වැටුනි. වෙළෙඳ මිල අනුව මිණීමේදී මෙම අනුපාතය සියයට 31·0 සිට සියයට 23·3 දක්වා අඩු විය.

## දළ දේශීය වියදම් සැකැසුමේ

| | 1959 | | | 1960 | | | 1961 | | | 1962 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය |
| 1. වියදම (වෙළෙඳ මිල අනුව) (රු. දශ ලක්ෂ) | 4,582·2 | 881·3 | 1118·1 | 4,960.6 | 911·0 | 1,022.1 | 4,847·9 | 926·2 | 1,037·4 | 4,951·6 | 979·4 | 1,100·8 | 5,241·8 |
| 2. ආනයන අඩංගුව (මි. ර. ගැ. මිල අනුව) | | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ | 1,426·3 | 88·1 | 365·2 | 1,364.8 | 125·8 | 336·2 | 1,165·6 | 71·2 | 305·0 | 1,104·3 | 56·7 | 309·9 | 983·8 |
| (ආ) සියයට ගණන | 31·1 | 10·0 | 32·7 | 27·5 | 13·8 | 32·9 | 24·0 | 7·7 | 29·4 | 22·3 | 5.8 | 28·2 | 18·8 |
| 3. ආනයන අඩංගුව (වෙළෙඳ මිල අනුව) | | | | | | | | | | | | | |
| (අ) ප්‍රමාණය රු. දශ ලක්ෂ | 1,989·7 | 97·3 | 565·5 | 2,058·9 | 139·0 | 518·7 | 1,845.3 | 78·7 | 471·6 | 1,868·0 | 62·7 | 478.9 | 1,675·6 |
| (ආ) සියයට ගණන | 43.4 | 11·0 | 50·6 | 41·5 | 15·3 | 50.7 | 38.1 | 8·5 | 45·5 | 37·7 | 6·4 | 43.5 | 32·0 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

සංඛ්‍යා සටහන II (අ) 9

අඩංගු සෘජු ආනයන

| | 1963 | | 1964 | | | 1965 | | | 1966 | | | 1967 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | පෞද්ගලික පරිභෝජනය | රජයේ පරිභෝජනය | දළ දේශීය හා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය |
| | 1,010·6 | 1,095·3 | 5,688·9 | 1,090·1 | 1,119·6 | 5,675·5 | 1,156·7 | 1,031·1 | 6,054·1 | 1,158·3 | 1,120·0 | 6,455·8 | 1,228·3 | 1,256·9 |
| | 51·8 | 292·5 | 1,431·3 | 47·2 | 294·5 | 945·3 | 59·3 | 218·7 | 1,305·8 | 80·8 | 304·4 | 1,008·9 | 78·9 | 315·0 |
| | 5·1 | 26·7 | 25·2 | 4·3 | 26·3 | 16·7 | 5·1 | 21·2 | 21·6 | 7·0 | 27·2 | 15·6 | 6·4 | 25·1 |
| | 57·2 | 465·5 | 1,861·4 | 52·3 | 486·3 | 1,719·2 | 65·5 | 386·7 | 1,876·5 | 89·3 | 512·0 | 1,505·5 | 87·2 | 522 2 |
| | 5·7 | 42·5 | 32·7 | 4·8 | 43·4 | 30·3 | 5·7 | 37·5 | 31·0 | 7·7 | 45·7 | 23·3 | 7·1 | 41·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (අ) 10

## දළ ජාතික නිෂ්පාදිතය 1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව

| | 1959 ස්ථාවර වටිනාකම | | | | | | | | | වෙනසේ සියයට ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1960/ 1959 | 1961/ 1960 | 1962/ 1961 | 1963/ 1962 | 1964/ 1963 | 1965/ 1964 | 1966/ 1965 | 1967/ 1966 |
| 1· කෘෂිකර්මය, දැව ඇ වන ද්‍රව්‍ය, දඩයම් සහ ධීවර කර්මාන්ත .. | 2,302·4 | 2,435·5 | 2,613·5 | 2,694·5 | 2,846.0 | 2,945·9 | 2,817·6 | 2,856·6 | 3,045·6 | + 5·8 | + 7·3 | +3·1 | + 5·6 | + 3·5 | − 4·4 | + 1·4 | + 6·6 |
| 2· පතල් හා ගල් කැඩීම .. | 31·3 | 32·4 | 31·8 | 33·2 | 29.5 | 32·1 | 33·1 | 33·8 | 35·7 | + 3·5 | — 1·9 | +4·4 | —11·1 | + 8·8 | + 3·1 | + 2·1 | + 5·6 |
| 3· නිෂ්පාදනය .. | 682·1 | 728·0 | 745·9 | 797·6 | 853.0 | 901·3 | 952·0 | 977·0 | 1,038·9 | + 6·7 | + 2·5 | +6·9 | + 6·9 | + 5·7 | + 5·6 | + 2·6 | + 6·3 |
| 4· ගොඩනැංවීම .. | 282·9 | 280·9 | 268·6 | 281·5 | 271.8 | 283·3 | 263·8 | 267·7 | 312·7 | — 0·7 | — 4·4 | +4·8 | — 3·4 | + 4·2 | — 6·9 | + 1·5 | +16·8 |
| 5· විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | 9·5 | 9·8 | 10·4 | 11·1 | 11·4 | 12·9 | 13·5 | 14·3 | 14·7 | + 3·2 | + 6·1 | +6·7 | + 2·7 | +13·2 | + 4·7 | + 5.9 | + 2·8 |
| 6· ප්‍රවාහනය, ගබඩා කිරීම සහ හ-ණිවුඩ හුවමාරුව | 540·9 | 584·8 | 565·7 | 608·1 | 591·8 | 640.7 | 698·4 | 746·9 | 764·8 | + 8·1 | — 3·3 | +7·5 | — 2·7 | + 8·3 | + 9·0 | + 6·9 | + 2·4 |
| 7· තොග හා සිල්ලර වෙළෙඳාම .. | 800·8 | 928·8 | 839·4 | 891·9 | 875·1 | 1,003·1 | 1,023·8 | 1,059·2 | 1,038·6 | +16·0 | — 9·6 | +6·3 | − 1·9 | +14·6 | + 2·1 | + 3·5 | − 1·9 |
| 8· බැංකු රක්ෂන හා අනෙකුත් මූල්‍ය .. | 50·9 | 51·8 | 58·5 | 64.2 | 67·4 | 73·6 | 90·4 | 83·0 | 98·5 | + 1.8 | +12·9 | +9·7 | + 5·0 | + 9·2 | +22·8 | − 8·2 | +18·7 |
| 9· නිවාස අයිතිය සහ පදිංචිය .. | 200·6 | 211·8 | 224·2 | 235·8 | 227·2 | 254·8 | 272·8 | 272·8 | 265.4 | + 5·6 | + 5·9 | +5·2 | — 3·6 | +12·1 | + 7·1 | ... | — 2·7 |
| 10· රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. | 301·0 | 314·4 | 323·5 | 343·7 | 365·1 | 363·3 | 371·9 | 396·5 | 388·9 | + 4·5 | + 2·9 | +6·2 | + 6·2 | — 0·5 | + 2·4 | + 6·6 | — 1·9 |
| 11· සේවා 8· | 727·6 | 754·2 | 783·3 | 798.1 | 812·3 | 886·0 | 921·8 | 941·4 | 973·7 | + 3.7 | + 3.9 | +1·9 | + 1·8 | + 9·1 | + 4·0 | + 2·1 | + 3·4 |
| 12· දළ දේශීය නිෂ්පාදිතය .. | 5,930·0 | 6,332·4 | 6,464·8 | 6,759.7 | 6,950·6 | 7,397·0 | 7,459·1 | 7,649·[illegible] | 7,977·5 | + 6·8 | + 2·1 | +4·6 | + 2·8 | + 6·4 | + 0·8 | + 2·5 | + 4·3 |
| 13· ශුද්ධ සාධක ආදායම .. | − 36·7 | − 43·9 | − 40·1 | − 49.8 | − 50·9 | − 33·7 | − 14·3 | − 36·1 | − 45.4 | | | | | | | | |
| 14· දළ ජාතික නිෂ්පාදිත .. | 5,893·3 | 6,288·5 | 6,424·7 | 6,709·9 | 6.899·7 | 7,363·3 | 7,444·8 | 7,613·1 | 7,932·1 | + 6·7 | + 2·2 | +4·4 | + 2·8 | + 6·7 | + 1·1 | + 2·3 | + 4·2 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටු බලන්න

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තවද ප්‍රාග්ධන සම්පාදනයෙහි ආනයන කොටස, මි. ර. ගැ. මිල අනුව, 1966 පැවැති සියයට 27·2, 1967 දී සියයට 25·1 දක්වා පහල වැටුනි. වෙළෙඳ මිල අනුව මිණීමේ දී, අනුපාතය සියයට 45·7 න් සියයට 41·5 දක්වා අඩු විය.

**මූර්ත නිෂ්පාදිතය සහ ආදායම්**

1959 ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ඇස්තමේන්තු 11 (අ) 10 වැනි සංඛ්‍යා සටහනින් පෙන්වා දී ඇත. 1967 දී ලංකාවේ මූර්ත නිෂ්පාදිතය සියයට 4·2 ක වැඩිවීමක් සටහන් කළ අතර, මෙය 1966 පැවැති සියයට 2·3 ක්වූ සංශෝධිත සංඛ්‍යාව හා සැසඳේ. මූර්ත නිෂ්පාදිතයේ වැඩිවීමට එකතුවූ ඉතාමත් වැදගත් කොටස කෘෂිකර්මාන්තයෙන්වූ අතර, තේ සහ පොල් වල මූර්ත වටිනාකම, අඩු වුවද, රබර්, වී, පශුධන, මාළු සහ අනිකුත් ආහාර වගාවන්වල පැහැදිලි ඉහල යාමක්, 1967 දී පෙන්නුම් කළේය. මෙයින් වඩා දෘෂ්‍යමාන වූයේ, සියයට 20·3 ක ඉහල යාමක් පලකළ කෘෂිකාර්මික නිෂ්පාදනයය.

නිෂ්පාදනයෙහි එකතු වූ අගය සියයට 6·3 කින් වැඩි විය. මෙයට හේතු වූයේ රබර්, සිමෙන්ති සහ සිගරැට්වලවූ උසස් මට්ටමේ නිමැවුමය. ගොඩනැගිලි කටයුතු වල වටිනාකම, ඇස්තමේන්තු කර ඇති පරිදි, සියයට 16·8 කින් ඉහල ගිය අතර, 1967 දී විශේෂයෙන් රජයේ සංස්ථාවලවූ ඉහල මට්ටමේ තැනිම් කටයුතුවල වැඩිවීම, මෙමගින් විද්‍යමාන විය.

ඇස්තමේන්තු කර ඇති පරිදි, බැංකු සහ රක්ෂණ කටයුතුවල සියයට 18·7 ක ඉහල යාමක් සිදුවිය. විවෘතවූ ශාඛාවන් ගණන සහ නිෂ්කාශන චෙක්පත් ප්‍රමාණය ඉහල යාම මගින් 1967 දී බැංකු කටයුතුවල වර්ධනයක් මේ මගින් පිළිබිඹු විය. 1967 දී ලංකාවේ නව ශාඛා කායර්ාල 28 ක්ද, ග්‍රාමීය බැංකු 14 ක්ද විවෘත විය. චෙක්පත් නිෂ්කාශනයේ වටිනාකමද 1966 මාසික සාමාන්‍යයවූ රුපියල් දශ ලක්ෂ 928·5 න් 1967 දී රුපියල් දශ ලක්ෂ 990·4 දක්වා ඉහල ගියේය.

ප්‍රවාහණ සේවයේ මූර්ත නිමැවුම, පණිවුඩ සහ බඩු ගබඩා කිරීම 1967 සියයට 2·4 කින් වැඩි විය. ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් සපයන ලද මගීන්ගේ සේවා ඉහල යෑම මෙයින් පිළිබිඹු කළේය. ඉහතින් සඳහන් කර ඇති පරිදි, ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් ධාවනය, 1967 සැතපුම් දශ ලක්ෂ 184·6 සිට 1967 සැතපුම් දශ ලක්ෂ 208·6 දක්වා ඉහල ගොස් ඇත.

1966 දී සියයට 2·5 ක් වූ ඉහල යාමට වඩා 1967 දී දළ දේශීය නිෂ්පාදිතයේ ස්ථාවර මිල සියයට 4·3 කින් ඉහල ගියේය. දළ ජාතික නිෂ්පාදිතය එනම් දළ දේශීය නිෂ්පාදිතය විදේශීය ශුද්ධ සාධක ආදායමේ ගැලපීමෙන් පසු, 1966 දී සියයට 2·3 ක සංශෝධිත සංඛ්‍යාව හා සසඳ බලන කල, සියයට 4·3 ක වැඩිවීමක් සටහන් විය.

ලංකාවේ මැදි වර්ෂ ජන සංඛ්‍යාව 1966 වර්ෂයට වඩා සියයට 2·2 කින් වැඩිවූ අතර, 11,741,000 වශයෙන් එය තාවකාලික ලෙස ඇස්තමේන්තුකර ඇත. මෑත අවුරුදුවල දී දිස්වුනු ජනගහනයේ වර්ධන අනුපාතිකයෙහි පහල වැටීමේ උපනතිය නොකැඩිව පැවතීම මෙයින් පැහැදිලි වෙයි. මැදි වර්ෂ පදනමේ සංඛ්‍යා අනුපාත වර්ධනය 1959 දී සියයට 2·8 ක් වූ බව ඇස්තමේන්තු කර ඇත. සංශෝධිත ඇස්තමේන්තු අනුව, 1966 දී මෙය එම මට්ටමේම පැවතිනි.

1967 දී සිදු වූ ආර්ථික ප්‍රසාරණය විමසා බැලිය යුත්තේ, අපනයනවල මිලෙහි පහල බැසීම සහ ආනයනවල මිලෙහි ඉහල යෑම පසුබිම් කොට ගෙනය. මෙය අවශ්‍ය යේ අපනයන සහ ආනයන, ලංකා අර්ථ ක්‍රමයෙහි වැදගත් අංශයක් වන හෙයිනි.

## සංඛ්‍යා සටහන II (අ) 11
## මූර්ත ජාතික ආදායම සහ වියදම

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. දළ ජාතික නිෂ්පාදිතය (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) .. | 5,893·3 | 6,288·5 | 6,424·7 | 6,709·9 | 6,899·7 | 7,363·3 | 7,444·8 | 7,613·1 | 7,932·1 |
| 2. පහත සඳහන් අපනයන නිසා වෙළෙඳ අනුපාතයේ බලපෑම් .. | | | | | | | | | |
| (i) තේ .. | | − 31·9 | − 36·9 | + 1·4 | −133·7 | −156·0 | −211·8 | −317·7 | −419·2 |
| (ii) රබර් .. | | + 37·3 | − 24·5 | − 13·3 | − 55·7 | − 93·7 | −103·5 | −145·3 | −190·1 |
| (iii) තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදිත | | − 26·0 | − 90·3 | − 79·6 | − 63·1 | − 84·4 | − 12·0 | − 44·6 | − 54·7 |
| (iv) අනෙකුත් නිෂ්පාදිත .. | | + 10·0 | + 1·1 | + 9·6 | + 10·7 | + 18·3 | + 18·4 | + 2·3 | − 1·8 |
| (v) සියලුම නිෂ්පාදිත .. | | − 10·6 | −150·6 | − 81·9 | −241·8 | −315·8 | −308·9 | −505·3 | −665·8 |
| 3. දළ ජාතික ආදායම් (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) .. | 5,893·3 | 6,277·9 | 6,274·1 | 6,628·0 | 6,657·9 | 7,047·5 | 7,135·9 | 7,107·8 | 7,266·3 |
| 4. ආධාර හැර වක්‍ර බදු (ගලපා) .. | 383,2 | 408·2 | 408·0 | 431·0 | 432·9 | 458·2 | 464·0 | 462·2 | 472·5 |
| 5, දළ ජාතික වියදම් (1959 ස්ථාවර වෙළෙඳ මිල අනුව) .. | 6,276·5 | 6,686·1 | 6,682·1 | 7,059·0 | 7,090·8 | 7,505·7 | 7,599·9 | 7,570·0 | 7,738·8 |

වෙනසේ සියයට ගණන

| | 1960/1959 | 1961/1960 | 1962/1961 | 1963/1962 | 1964/1963 | 1965/1964 | 1966/1965 | 1967/1966 |
|---|---|---|---|---|---|---|---|---|
| 1. දළ ජාතික නිෂ්පාදිතය (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) .. | + 6·7 | + 2·2 | + 4·4 | + 2·8 | + 6·7 | + 1·1 | + 2·3 | + 4·2 |
| 2. පහත සඳහන් අපනයන නිසා වෙළෙඳ අනුපාතයේ බලපෑම් .. | | | | | | | | |
| (i) තේ .. | | | | | | | | |
| (ii) රබර් .. | | | | | | | | |
| (iii) තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදිත | | | | | | | | |
| (iv) අනෙකුත් නිෂ්පාදිත .. | | | | | | | | |
| (v) සියලුම නිෂ්පාදිත .. | | | | | | | | |
| 3. දළ ජාතික ආදායම් (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) .. | + 6·5 | − 0·1 | + 5·6 | + 0·5 | + 5·7 | + 1·4 | + 0·4 | + 2·2 |
| 4. ආධාර හැර වක්‍ර බදු (ගලපා) .. | | | | | | | | |
| 5, දළ ජාතික වියදම් (1959 ස්ථාවර වෙළෙඳ මිල අනුව) .. | + 6·5 | − 0·1 | + 5·6 | + 0·5 | + 5·9 | + 1·3 | − 0·4 | + 2·2 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සාධක මිලට අනුව දළ ජාතික නිෂ්පාදනයෙහි අපනයන වල වටිනාකමද වෙළෙඳ මිල අනුව දළ ජාතික වියදමෙහි ආනයන වල වටිනාකමටද 1967 දී සියයට 21 පමණි. 1967 දී අපනයනවල මිල සියයට 6·3 කින් අඩුවූ අතර, ආනයනවල මිල සියයට 3·5 කින් වැඩිවුයෙන් වෙළෙඳ අනුපාතයේ පිරිහීමේ උපනතිය දිගටම පැවතිනි. 1967 දී පහල වැටීම සියයට 9·4 ක්වූ අතර, 1966 දී පහල වැටීම සියයට 13·1 ක් විය. මූර්ත ජාතික ආදායම යටතේ එන II (අ) 11 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති අයුරු වෙළෙඳ අනුපාතිකයෙහි පිරිහීමෙන්වූ අනිෂ්ට විපාක, පදනම් වර්ෂයවූ 1959 සිට මණින කල රුපියල් දශ ලක්‍ෂ 666 ක් යයි ඇස්තමේන්තුකොට ඇත. 1966 දී මෙන් මෙය රුපියල් දශ ලක්ෂ 505 ක් වූයේය. වෙළෙඳ අනුපාතිකයේ අනිෂ්ට විපාක සම්බන්ධයෙන් මූර්ත නිෂ්පාදනයෙහි ඇස්තමේන්තු ගැලපීමෙන් ලබාගත් මූර්ත ජාතික ආදායම, රුපියල් දශ ලක්ෂ 7108 සිට රුපියල් දශ ලක්ෂ 7266 දක්වා 1967 දී වැඩිවුනි. ලංකාවේ මූර්ත නිෂ්පාදනයෙහි වූ සියයට 4·2 ක වැඩිවීම හා සංසන්දනය කරන විට, මෙය සියයට 2·2 කින් පමණක්වූ වැඩිවීමකි. මූර්ත ආදායමේ වැඩිවීමේ අනුපාතිකය, ජනගහනය වැඩිවීමේ අනුපාතිකය හා සමවූ හෙයින් ලංකාවේ ඒකජන මූර්ත ආදායම 1966 සිට 1967 කාලය තුල දී නොවෙනස්ව පැවතුනි.

### නිෂ්පාදනය සහ අපනයනය

II (අ) 12 සංඛ්‍යා සටහන, ප්‍රධාන කෘෂිකාර්මික භෝග නිෂ්පාදන ප්‍රමාණයන් සහ II (අ) 13 සංඛ්‍යා සටහන ජංගම සහ ස්ථාවර මිල යටතේ අපනයන වටිනාකම පෙන්වයි. 1966 වසරේදී වී නිෂ්පාදනය සියයට 27·0 කින් වැඩි වී තිබූ අතර, 1967 වසරේදී එය තව දුරටත් බුසල් දශ ලක්‍ෂ 9·4 කින් හෙවත් සියයට 20·6 කින්, බුසල් දශ ලක්ෂ 55·1 දක්වා වැඩි විය. අපනයන අංශ දෙස බලන විට, 1967 වසරේදී රබර් නිෂ්පාදනයේ වැඩිවීම පැවතුණු අතර, තේ සහ පොල් නිෂ්පාදනය පහත වැටුණි.

### තේ

1967 වසරේ තේ නිෂ්පාදනය වූ රාත්තල් දශ ලක්ෂ 487, 1966 වසරේ නිෂ්පාදනයවූ රාත්තල් දශ ලක්ෂ 490 හා සසඳන විට, රාත්තල් දශ ලක්ෂ 3 ක හෙවත් සියයට 0·6 ක පහත වැටීමෙක් දක්වයි. කොළඹ වෙළෙඳපලේ දී සියළුම වර්ගවල තේ රාත්තලක සාමාන්‍ය මිළ ශත 7 කින් අඩු විය. කෙසේ හෝ 1967 වසර තුලදී තේ අපනයනය 1966 වසරට වඩා රාත්තල් දශ ලක්ෂ 37 කින් වැඩි විය. සාමාන්‍ය නැ. වි. ස. මිළ රාත්තලකට ශත 11 කින් අඩු වුවද, මුළු අපනයන වටිනා කම රුපියල් දශ ලක්ෂ 33 කින් වැඩි විය.

තේ පාලන දෙපාර්තමේන්තුවේ වර්තා වලට අනුව, 1967 වසර අවසානයේ දී තේ වගාකර තිබූ ප්‍රමාණය වූ අක්කර 598 814 කි. මෙය 1966 දී අක්කර 596,445 ක් විය. 1967 දී අක්කරයක අස්වැන්න රාත්තල් 816 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇති අතර, මෙය 1966 දී අක්කරයකට රාත්තල් 823 ක් විය. නැවත වගා කිරීමේ හා නගා සිටුවීමේ ආධාර ක්‍රමයන් 1967 දී ද ක්‍රියාත්මක විය. නැවත රබර් වගා කිරීම් තේ වගාවට හැරවීයෙන් සහ නැවත වගා කිරීමේ ආධාර ක්‍රමයන් යටතේ 1966 වර්ෂයේ දී ආධාර වශයෙන් ගෙවූ මුදල රුපියල් දශ ලක්‍ෂ 14·5 ක්වූ අතර 1967 දී මෙම මුදල රුපියල් දශ ලක්‍ෂ 14·9 ක් විය.

### රබර්

1967 වසර අවසානය වනවිට, රබර් වගා කොට තිබූ ප්‍රමාණය අක්කර 573,226ක් වේ යැයි ඇස්තමේන්තුකර ඇති අතර, ඉකුත් වසරේ දී වගාකොට තිබූ ප්‍රමාණය අක්කර 567,744 ක් විය. නැවත වගා කරනු ලැබූ ප්‍රමාණය 1966 වසරේ අක්කර

## සංඛ්‍යා සටහන II (අ) 12

### ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල නිමයුම් ප්‍රමාණ

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | ප්‍රතිශතයේ වෙනස | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | 1960/ 1959 | 1961/ 1960 | 1962/ 1961 | 1963/ 1962 | 1964/ 1963 | 1965/ 1964 | 1966/ 1965 | 1967/ 1966 |
| තේ (රාත්තල් දශලක්ෂ) .. | 413 | 435 | 455 | 467 | 485 | 482 | 503 | 490 | 487 | + 5·3 | + 4·6 | + 2·6 | + 3·9 | − 0·6 | + 4·4 | − 2·6 | − 0·6 |
| රබර් (රාත්තල් දශලක්ෂ) .. | 205 | 218 | 215 | 229 | 231 | 246 | 261 | 289 | 316 | + 6·3 | − 1·4 | + 6·5 | + 0·9 | + 6·5 | + 6·1 | +10·7 | + 9·3 |
| පොල් නිෂ්පාදිත (පොල්ගෙඩි දශලක්ෂ වලින්) .. | 2,313 | 2,183 | 2,601 | 2,811 | 2,557 | 3,000 | 2,681 | 2,468 | 2,421 | − 5·6 | +19·1 | + 8·1 | − 9·0 | +17·3 | −10·6 | − 7·9 | − 2·0 |
| වී (බුසල් දශලක්ෂ වලින්) .. | 36·5 | 43·1 | 43·2 | 48·1 | 49·2 | 50·5 | 36·3 | 45·7 | 55·1 | +18·1 | + 0·2 | +11·3 | + 2·3 | + 2·6 | −28·1 | +25·9 | +20·6 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

11,583 හා සසඳන විට, 1967 වසරේ ප්‍රමාණය අක්කර 10,075 කි. 1967 දී රබර් නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 316 ක් විය. මෙය ඉකුත් වසරේ නිෂ්පාදනයට වඩා රාත්තල් දශ ලක්ෂ 27 ක හෙවත් සියයට 9·3 ක වැඩිවීමකි. 1967 නිෂ්පාදනයේ මෙම වැඩිවීම, පිළිබිඹු වූයේ වැඩි කොටසක් නැවත වගා කරන ලද ප්‍රදේශවල අස්වැන්න නිෂ්පාදනයට එකතු වීම සහ ලබාගන්නා ලද වැඩි අස්වැන්නත් නිසාය. 1966 දී අක්කරයක අස්වැන්න වූ රාත්තල් 609, 1967 දී අක්කරයකට රාත්තල් 647 දක්වා වැඩි වූ අතර, නිෂ්පාදනයේ පැවති අක්කර 475,610, 1967 දී අක්කර 417,702 දක්වා වැඩි විය. කොළඹ වෙළඳපොලේ ආර්. එස්. එස්. නො, 1 රබර් රාත්තලක සාමාන්‍ය මිල ශත 10 කින් හෙවත් සියයට 11·2 කින්, ශත 79 ට පහල වැටුනි.

1966 දී අපනයනය කළ රබර් රාත්තල් දශ ලක්ෂ 298 හා සසඳන විට, 1967 දී අපනයනයකළ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 291 ක් විය. 1966 දී රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල වූ රුපියල් 1·13, 1967 දී රාත්තල ශත 97 දක්වා පහළ වැටුනි.

**පොල්**

රට තුල ප්‍රයෝජනයට ගත් හා අපනයනය කරනලද පොල් ගෙඩි ප්‍රමාණය අනුව සැකසු ඇස්තමේන්තු අනුව, 1967 පොල් නිෂ්පාදනය 1966 සංඛ්‍යාව වූ ගෙඩි දශ ලක්ෂ 2466 සිට ගෙඩි දශ ලක්ෂ 2421 දක්වා අඩු විය. මෙය සියයට 1·9 ක පහල වැටීමකි. නිෂ්පාදනයේ පහල වැටීමට හේතු වූයේ ඉකුත් වර්ෂවල පැවැති නියගයයි. 1967 දී පොල් අපනයනය (ගෙඩි ප්‍රමාණය අනුව) 1966 දී අපනයන ප්‍රමාණය වූ ගෙඩි දශ ලක්ෂ 1029 සිට ගෙඩි දශලක්ෂ 951 දක්වා, එනම් ගෙඩි දශ ලක්ෂ 78 කින් හෙවත් සියයට 7·6 කින් පහල වැටුනි. පොල්තෙල්, කොප්පරා සහ කපාපු පොල් යන ප්‍රධාන පොල් නිෂ්පාදන තුනේම නැ. වි, ස. මිල අපනයන මිල දර්ශකයෙන් දැක්වෙන පරිදි 1966 වසරේ දර්ශකය වූ 90·2 සිට 1967 දී 84·5 ට පහල වැටුනි. අපනයන ප්‍රමාණයෙහි හා සාමාන්‍ය නැ. වි. ස. මිලෙහි පහල වැටීම නිසා 1967 දී අපනයන වටිනාකම 1966 වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 196 සිට රුපියල් දශ ලක්ෂ 167 දක්වා පහල වැටුනි.

පොල් වගාව නගා සිටුවීමේ ක්‍රමය සහ පොල් ආධාර ක්‍රමය 1967 දී ද ක්‍රියාත්මක විය. නගා සිටුවීමේ ක්‍රමය යටතේ පොල්පැල, 14,15,727 ක් සහනදායි මිල වූ පැලයක් ශත 25 බැගින් බෙදහරින ලදී. 1966 දී මෙසේ බෙදා දෙන ලද පොල් පැල සංඛ්‍යාව 1,12,8139 ක් විය. පොහොර ආධාර ක්‍රමය යටතේ 1967 දී පොහොර ටොන් 56,500 ක් බෙදාහරින ලද අතර මෙම ආධාරය සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 10 ක් විය. 1966 දී බෙදා හරින ලද පොහොර ප්‍රමාණය ටොන් 55,000 ක් වූයේය.

**වී**

1967 වී නිෂ්පාදනය වාර්තාවක් පිහිටුවමින් බුසල් දශ ලක්ෂ 55·1 ක් දක්වා ඉහල ගියේය. 1966 නිෂ්පාදනය වූ බුසල් දශ ලක්ෂ 45·7 හා සමඟ සසඳන විට මෙය සියයට 20·6 ක වැඩිවීමකි. 1966/67 මහ කන්නයේ අස්වැන්න ඉකුත් වසරේ මහ කන්නයේ අස්වැන්නට වඩා සියයට 13·7 කින් වැඩිවිය. ඇස්තමේන්තු කර ඇති යල කන්නයේ අස්වැන්න වූ බුසල් දස ලක්ෂ 20·2, ඉකුත් වසරේ මෙම කන්නයට වඩා සියයට 34·7 කින් වැඩි විය. 1967 නිෂ්පාදනය, ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන යෝජනා වලින් බලාපොරොත්තු වූ ඉලක්කයට වඩා බුසල් දශ ලක්ෂ 1·7 කින් වැඩි බව මෙහි ලා සඳහන් කිරීම වටී. 1965/66 මහ කන්නයේ අස්වැන්න වූ අක්කරයකට බුසල් 35·9 හා සසඳන විට 1966/67 මහ කන්නයේ අස්වැන්න අක්කරයකට බුසල් 40·85 විය. 1966 අක්කරයට බුසල් 35·04 ක්වූ යල කන්නයේ නිෂ්පාදනය 1967 දී අක්කරයකට බුසල් 42·33 ක් විය. මෙම සංඛ්‍යා ලංකාවේ වී නිෂ්පාදනයේ නොකඩවා පැවැති වර්ධනය ස්ථිර කරයි.

1967 දී ඇති වූ නිෂ්පාදිතයේ වැඩිවීමට හේතුවූයේ විවෘත වෙළඳපලේ මිල වැඩිවීම, පොහොර වැඩියෙන් යෙදීම, උසස් වර්ගයේ බිත්තර වී යෙදීම වැඩි වශයෙන් වීම, ග්‍රාමීය කොට්ඨාශ හා දිස්ත්‍රික්ක අනුව ණය පහසුකම් ඇතිවීම සහ රජය මගින් ගෙන ගිය විශාල ප්‍රචාරක වැඩ පිළිවෙල යන කරුණුය. 1967 දී විවෘත වෙළඳපලේ මිල වැඩිවීම වූයේ, 1966 දෙසැම්බර් මාසයේ දී සහල් සලාකය සේරු 2 සිට 1 දක්වා අඩුකිරීම නිසාය. 1967 නොවැම්බර් මාසයේ දී, වී වල නියමිත මිල ද, බුසලක් රුපියල් 12 සිට 14 දක්වා වැඩි කරන ලදි.

අපනයන වටිනාකම —

| | පවත්නා මිල | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | වෙනසේ | | |
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1963/ 1962 | 1964/ 1963 | 1965/ 1964 |
| **දේශීය අපනයන** | | | | | | | | | | | | |
| තේ .. | 1,046 | 1,097 | 1,115 | 1,149 | 1,141 | 1,142 | 1,210 | 1,027 | 1,060 | — 0·7 | + 0·1 | + 6·0 |
| රබර් .. | 298 | 378 | 260 | 290 | 257 | 290 | 304 | 338 | 282 | —11·5 | +12·9 | + 4·9 |
| තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදන .. | 244 | 184 | 202 | 228 | 198 | 274 | 275 | 196 | 167 | —12·9 | +37·9 | + 0·6 |
| අනෙකුත් .. | 105 | 116 | 104 | 99 | 109 | 137 | 127 | 116 | 72 | + 9·6 | +25·5 | — 7·2 |
| **එකතුව** .. | 1,692 | 1,775 | 1,681 | 1,766 | 1,705 | 1,842 | 1,916 | 1,676 | 1,581 | — 3·5 | + 8·1 | + 4·0 |
| **ප්‍රති අපනයන එකතුව** .. | 62 | 57 | 52 | 42 | 26 | 34 | 33 | 24 | 59 | —38·2 | +30·8 | — 4·6 |

විස්තර සටහන් සඳහා 42 වැනි පිටුව බලන්න.

සංඛ්‍යා සටහන II (ඇ) 13

නැ. වි. ස.

| සියයට ගණන | | ස්ථාවර මිල | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | වෙනසේ සියයට ගණන | | | | |
| 1966/1965 | 1967/1966 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1963/1962 | 1964/1963 | 1965/1964 | 1966/1965 | 1967/1966 |
| —15·1 | + 3·2 | 1,046 | 1,116 | 1,159 | 1,230 | 1,241 | 1,240 | 1,348 | 1,202 | 1,252 | + 0·9 | — 0·1 | + 8·7 | —10·8 | + 4·1 |
| +11·0 | — 16·6 | 298 | 337 | 286 | 324 | 305 | 368 | 388 | 435 | 424 | — 5·9 | +20·7 | + 5·4 | +12·1 | — 2·5 |
| —28·9 | — 14·8 | 244 | 208 | 294 | 324 | 256 | 343 | 269 | 213 | 193 | —21·0 | +34·4 | —21·6 | —21·1 | — 9·3 |
| — 8·4 | — 37·9 | 105 | 105 | 103 | 97 | 95 | 111 | 100 | 97 | 105 | — 2·1 | +17·0 | — 9·8 | — 3·1 | + 7·7 |
| —12·5 | — 5·7 | 1,692 | 1,766 | 1,841 | 1,974 | 1,896 | 2,062 | 2,105 | 1,947 | 19,74 | — 4·0 | + 8·7 | + 2·1 | — 7·5 | + 1·4 |
| – 27·3 | +145·8 | 62 | 58 | 57 | 49 | 29 | 38 | 40 | 29 | 65 | —39·9 | +31·0 | + 5·3 | —27·5 | +124.1 |

මූලය: ලංකා රේගු වාර්තා,
ශ්‍රී ලංකා මහ බැංකුව

## ජාතික නිෂ්පාදනය සහ වියදම පිළිබඳ පාරිභාෂික සටහන.

### ජාතික වියදම පිළිබඳ විස්තර

දළ ජාතික නිෂ්පාදිතය හා සම්බන්ධ ඇස්තමේන්තුවල ඇති නොයෙක් ඌනතාවයන් වඩාත් හොඳින් සැකසීමේ ප්‍රතිපත්තිය මහ බැංකුව, මෑත වර්ෂවලදී දිගටම අනුගමනය කරන ලදී. මෙතෙක් පළ කර ඇති ඇස්තමේන්තුවල බලවත් අඩුපාඩුවක් නම්, එක්සත් ජාතීන්ගේ නිර්වචනය පරිදි, කාර්මික නිෂ්පත්තිය අනුව දළ දේශීය නිෂ්පාදිතය හා සම්බන්ධ සංඛ්‍යා නොතිබීමයි. පසුගිය වාර්ෂික වාර්තාවල පළ කළ පරිදි, කාර්මික නිෂ්පත්තිය අනුව, දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරන ලද්දේ, එක්සත් ජාතීන් විසින් නිර්දේශ කරන ලද ක්‍රමයට අනුව නොව, එක්සත් ජාතීන්ගේ ක්‍රමයෙන් යොදාගත් විශ්ලේ-ෂණය කිරීමේ ක්‍රමයක් අනුවය. මෙම සංඛ්‍යා තොරතුරු, දළ දේශීය නිෂ්පාදිතයේ නියම කාර්මික නිෂ්පතතිය පිළිබඳ ස්වරූපය තරමක් දුරට විකෘති කොට දක්විය; මේ අනුව, එක්සත් ජාතීන් විසින් නිර්දේශ කර ඇති පරිදි, කාර්මික නිෂ්පතතිය අනුව, දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ ඇත්තමේන්තු වලියක් ප්‍රථම වරට, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත. ආර්ථික විග්‍රහයකට අත්‍යාවශ්‍ය වූ සංසන්දනය කළ හැකි ඇස්තමේන්තු වලියක් සැකසීමට, මෙම සංඛ්‍යා තොරතුරු 1959 සිට දක්වා ඇත.

පසුගිය වාර්ෂික වාර්තාවල සඳහන් ඇස්තමේන්තු, සාමාන්‍යයෙන්, නිෂ්පාදනය සහ ආදායම් සම්බන්ධ කොට පිළියෙල කෙරිණි[2]. නිෂ්පාදන අනුව, පිළියෙල කිරීම යටතේ අනුගමනය කරනු ලැබූ පිළිවෙත වූයේ නිෂ්පාදකයින්ගේ මිලට, අවසානවරට පාවිච්චි කිරීම සඳහා නිෂ්පාදිත භාණ්ඩවල අගය ඇස්තමේන්තු කිරීම සහ එයින් පාවිච්චි කරන ලද ආනයන ද්‍රව්‍යවල වටිනාකම අඩු කිරීමය. සංශෝධිත ඇස්ත-මේන්තු පිළියෙල කිරීමේදී, මෙම වාර්තාවේද, නිෂ්පාදිත සහ ආදායම් සම්බන්ධ කොට පිළියෙල කිරීමේ ක්‍රමය උපයෝගී කොට ගන්නාලදී. කෙසේ වෙතත්, නිෂ්-පාදිත අනුව, පිළියෙල කිරීමේ ක්‍රමය යටතේ, අනුගමනය කරනු ලැබූ පිළිවෙත වූයේ, නිෂ්පාදනය කළ භාණ්ඩ සහ සේවාවල අගය නිෂ්පාදකයින්ගේ මිල අනුව ඇස්තමේන්තු කොට, එයින්, කර්මාන්තයෙන් පිට මිල දී ගත් භාණ්ඩ සහ සේවාවල වටිනාකම අඩු කිරීමය.

කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ නිර්දේශ වලින්, වැදගත් වෙනස්වී යාමක් සලකා ගත යුතුය. ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේ අරමුණ සඳහා, ලංකාවේ අපනයන බදු, සම්ප්‍රදායක් වශයෙන් ඍජු බදු ලෙස සහ සාධක ගෙවීම්වල කොටසක් වශයෙන්ද සලකන ලදී. මෙම පුරුද්ද සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී, දිගටම පවත්වාගෙන යනලදී. කෙසේ නමුත්, අපනයන බදු හැර දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු, දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු වලින් පහත දක්වා ඇති අපනයන බදු පිළිබඳ සංඛ්‍යා තොරතුරු අඩු කිරීමෙන් ලබාගත හැකිය.

---

1 1964 එ. ජා. ජාතික ගිණුම් ක්‍රමය සහ ආධාරක සංඛ්‍යා සටහන් බලන්න.

2 වැඩිදුර විස්තර සඳහා 1952, කේ. විලියම්ස් මහතා විසින් සම්පාදිත ලංකා ජාතික ආදායම සහ 1961, 1962 සහ 1966 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා බලන්න.

## දළ දේශීය නිෂ්පාදන ඇස්තමේන්තුවල ඇතුලත් අපනයන බදු පිළිබඳ සංඛ්‍යා තොරතුරු.

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. කෘෂිකර්මාන්ත, වන කර්මාන්ත, දඩයම් සහ ධීවර කර්මාන්ත .. | 166·7 | 149·3 | 150·2 | 149·7 | 143·8 | 144·0 | 154·6 | 128·1 | 124·7 |
| 2. කැණීම් සහ පතල් කර්මාන්තය. .. | 0·4 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| 3. නිෂ්පාදන කටයුතු. .. | 170·4 | 152·4 | 155·0 | 154·6 | 148·6 | 149·1 | 158·0 | 131·8 | 128·0 |

පසුගිය අවුරුදුවල කෘෂිකර්මාන්තය යටතේ ගැනෙන කාර්යයන් වශයෙන් සැලකූ තේ, රබර් සහ පොල් සැකසීමේ දී එකතු වූ වටිනාකමේ අගය ඇස්තමේන්තු කිරීමේ දී, "නිෂ්පාදන කටයුතු" යටතේ ඇතුලත් කිරීම පිළිබඳව අවධානය කළ යුතුය. ඒවායේ නිෂ්පත්තිය සහ ඇස්තමේන්තු කිරීම කරන ලද්දේ, නිෂ්පාදන වියදම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු වලිනි. තේ, රබර් සහ පොල් සැකසීමේ ක්‍රමයන්ගේ එකතු වූ වටිනාකම තේ, රබර් සහ පොල් වගා කර්මාන්තයන්ගෙන්, හිතුවක්කාර ආකාරයට වෙන් කරන ලද්දේ, සම්බන්ධිත ද්විවිධ සැකසීම් ක්‍රමයන්ට අදාළ නිෂ්පාදන වියදම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු පැවැති නිසාය.

සවිස්තර පදනමක් මත, ස්ථාවර සාධක වියදම් මිලට දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු මෙම වාර්තාවෙන් ඉදිරිපත් කිරීමට හැකිවී ඇත. මෙම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී, හැකි වූ සැම විටම 1959 පාදවර්ෂය සඳහා, පවත්නා මිලට එකතු වූ වටිනාකම ඇස්තමේන්තු, පරිමා දර්ශක වලින් වඩාත් වැඩි කොට දක්වන ලදී. කෘෂිකර්මාන්තය, වන කර්මාන්තය සහ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් මෙය පහසුවිය. අනෙක් කර්මාන්තයන් පිළිබඳව පවත්නා මිලෙන් ප්‍රකාශිත වටිනාකම් පිළියෙළ කොට ඇති' මිළ සහ වැටුප් දර්ශක උපයෝගී කොට ගැනීමෙන් අඩු කරන ලදී.

**ජාතික වියදමෙහි ඇස්තමේන්තු.**

පහත සඳහන් හේතුන් කරන කොටගෙන ජාතික වියදම් වලිය සංශෝධනය කරන ලදී.

**මාළු**

බැංකුව විසින් ලබා ගන්නා ලද සංශෝධිත දත්තයන් පදනම් කොට ගෙන මාළු නිෂ්පාදනයේ ඇස්තමේන්තු සංශෝධනය කර ඇත.

**වෙනත් ආහාර භෝග.**

මෙය (1) එළවළු සහ පළතුරු සහ (2) අතිරේක ආහාර භෝග යනුවෙන් කොටස් දෙකකින් යුත්තය. මීට පෙර, අතිරේක ආහාර භෝගවල ඇස්තමේන්තු ඒකජන පාරිභෝජන දත්තයන් පදනම් කොට ගෙන සකස් කර ඇති අතර, සංශෝධිත ඇස්තමේන්තු සකස් වී ඇත්තේ සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සපයන ලද නිෂ්පාදන සංඛ්‍යා පදනම් කොට ය.

**ප්‍රාග්ධන සම්පාදනය.**

ගොඩනැගිලි ඉදිරි කිරීමේ ඇස්තමේන්තු, සකස් කිරීමේ දී 1966 වාර්ෂික වාර්තාවේ විස්තර කරන ලද පිළිවෙත ම අනුගමනය කොට ඇත. බැංකුව වෙත, රජයේ සංයුක්ත මණ්ඩල මගින් සපයන ලද දත්තයන් සංශෝධනය කර ඇති හෙයින්, 1963 දී ආනයන කරන ලද ගොඩනැගිලි උපකරණ ද ගොඩනැගිලි උපකරණවල ආනයන ආදේශවල වටිනාකම සහ ගොඩනැගිලි ඉදි කිරීමේ වටිනාකම අතර, අනුපාතය සංශෝධන කර ඇත.

## විස්තරාත්මක සටහන්

### පොදු වශයෙන්

1. පලකර ඇති මූල (ලංකා රේගු වාර්තා වැනි) හා සමහර නියත ශීර්ෂයන් (උද: කාර්මික නිමැවුම සඳහා කර්මාන්ත දෙපාර්තමේන්තුව) වෙනුවෙන් විශේෂ මූල ද හැර, මෙහි දැක්වෙන සංඛ්‍යා සටහන් සඳහා අවශ්‍ය මූලික සංඛ්‍යා තොරතුරු වැඩි හරියක් සපයා ඇත්තේ සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසිනි.

2. සංඛ්‍යා කිට්ටුම දශමස්ථානයට ගෙන ඒම නිසා ශීර්ෂ එකතු වලින් වෙනස් විය හැක.

3. සංඛ්‍යා සටහන් වල දක්වා ඇති වෙනස්වීමේ සියයට ගණන සකසා ඇත්තේ, වටිනාකම රුපියල් දශ ලක්ෂ වලින් මුල් දශමස්ථානයට ගෙන ඊමෙනි.

4. අ. නැ. නො: – අන්තැනක නොසඳහන්.

5. 1965 – 1967 සඳහා වූ ඇස්තමේන්තු තාවකාලිකය.

සංඛ්‍යා සටහන 11 (අ) – 1

(අ) ශීර්ෂය 6 – වෙළඳ භාණ්ඩ අපනයන නැ. වි. ස. මිලට තක්සේරු කොට ඇත.
(අ) ශීර්ෂය 7 – වෙළඳ භාණ්ඩ ආනයන මි. ර. ගැ. මිලට තක්සේරු කොට ඇත.
(අ) 8,9 හා 10 ශීර්ෂ – ඒකජන සංඛ්‍යා සැකැසීම සඳහා පහත දැක්වෙන ජනගහන ඇස්තමේන්තු උපයෝගී කොට ගෙන ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය – මැද | 1959 | 1960 | 1961 | 1962 | 1963 |
| ජනගහනය | 96,25,000 | 98,96,000 | 1,01,68,000 | 104,43,000 | 1,07,12,000 |
| වර්ෂය – මැද | 1964 | 1965 | 1966 | 1967 | |
| ජනගහනය | 1,09,71,000 | 1,12,32,000 | 1,14,91,000 | 1,17,41,000 | |

සංඛ්‍යා සටහන II (අ) 2 මෙම වාර්තාවේ දැක්වෙන නව සංඛ්‍යා සටහනකි. පසුගිය පිටෙහි දැක්වෙන පරිශෝගික විස්තර මගින් සාකච්ඡා කළ 1959 – 67 දළ දේශීය නිෂ්පාදනයේ සංශෝධිත ඇස්තමේන්තු මෙහි දක්වා ඇත. වර්තන සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සහ වර්තන සාධක මිල අනුව කාර්මික මූලයේ දළ ජාතික නිෂ්පාදිතය'' යන ප්‍රස්තුතය යටතේ පසුගිය වාර්ෂික වාර්තාවන්හි වූ II (අ) 2 සහ II (අ) 11 යන සංඛ්‍යා සටහන් මෙම සංඛ්‍යා සටහන මගින් ආදේශ වී ඇත. II (අ) 2 සංඛ්‍යා සටහනෙහි සමහර ශීර්ෂයන් පිළිබඳව විස්තර සැපයූ පසුගිය වාර්තාවල පැවැති II (අ) 3 වැනි සංඛ්‍යා සටහන මෙම වාර්ෂික වාර්තාව මගින් ඉවත්කර ඇත.

සංඛ්‍යා සටහන 11 (අ) 3

1 (අ) ශීර්ෂ (1): භාණ්ඩ සිල්ලර මිලට තක්සේරු කොට ඇත.

1 (ආ) ශීර්ෂ (1): නිෂ්පාදනය කළ දේශීය භාණ්ඩ මෙම ශීර්ෂයෙහි ඇතුලත් කොට ඇති, තේ සහ පොල්වල ඇස්තමේන්තු සකස් කොට ඇත්තේ ඒකජන පාරිභෝජන පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කොට ගැනීමෙන් වූ අතර, 1956 සිට 1962 දක්වා වූ වර්ෂයන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා 1953 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන් සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලදී. 1963 සිට ඇස්තමේන්තු සඳහා සංඛ්‍යා තොරතුරු ලබාගන්නා ලද්දේ 1963 පාරිභෝගික අයවැය සමීක්ෂණයෙන්ය. මේ අනුව 1963 සිට ඉදිරියට වූ ඇස්තමේන්තු ඊට පෙර වර්ෂවල ඇස්තමේන්තු සමග නියත වශයෙන් සැසඳෙන්නේ නැත.

ශීර්ෂ IV (i) සහ (ii): පහත සඳහන් ශීර්ෂයන්හි පමණක් තොග වෙනස්වීම්:– ආනයන කළ සහල් තිරිඟු පිටි සහ සීනි, සහතික මිලට ගත් වී, අරක්කු.

ශීර්ෂය V (iii): තේ, රබර්, පොල්තෙල්, සහ පශු සම්පත් වල තොග වෙනස් වීම පමණකි.

ශීර්ෂය VI – පිටරට ශුද්ධ ආයෝජන = මෙරට වර්තන ගිණුම් අතිරික්තය

සංඛ්‍යා සටහන II (අ) - 4

ශීර්ෂය 2 – පළාත් ආණ්ඩු සහා බදු අයත් වෙයි.

ශීර්ෂය 8 – පාරිභෝගික වියදම හා දළ ජාතික ප්‍රාග්ධන සම්පාදන වියදම් සමාන වෙයි.

ශීෂය 14 – මෙම සංඛ්‍යා සටහනෙහි ශීර්ෂ II සහ 12 විජන චෛක්‍ය II (අ) 4 සංඛ්‍යා සටහනේ VIII ශීර්ෂයේ දක්වෙන දළ ජාතික වියදමට සමානය. මෙය මේ සංඛ්‍යා සටහනේ 14 වැනි ශීර්ෂයට වඩා වෙනස් වන්නේ, දළ ජාතික නිෂ්පාදිත වියදමට සමානවය. මෙම සංඛ්‍යා සටහනේ 14 වැනි ශීර්ෂය (වෙළඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සඳහා වූ වියදම) 11 සහ 12 ශීර්ෂයන්ගේ විජන චෛක්‍යයට වෙනස් වන්නේ 13 වන ශීර්ෂයේ සඳහන් ප්‍රමාණයෙනි. (තොගවල නොදත් වෙනස් කම් හා සංඛ්‍යා විෂමතා)

සංඛ්‍යා සටහන II (අ) – 5

ශීර්පය (අ) (I): තේ සහ පොල් සඳහා වන ඇස්තමේන්තු සඳහා II (අ) 2 සංඛ්‍යා සටහනේ 6 වැනි සටහන බලන්න.

ශීර්ෂ (ආ) (IV): පුද්ගලයන් සඳහා මූල්‍ය සේවා ව්‍යාපාර වලින් බාහිරව බැංකු රක්ෂණ සමාගම් සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් ගෙවැයියනට කරන ලද සේවාවන්ගේ වටිනාකම.

ශීර්ෂ (ආ) (IV): වෘත්තිය හා ආයතන සේවා – අන්තැනක නොසඳහන් – පෞද්ගලික වෛද්‍ය, නීති හා අධ්‍යාපනික සේවා සහ ලාභ නොඋපයන පුද්ගල මණ්ඩල (ආගමික සහ සුබසාධක සංවිධාන, වෘත්තිය සමිති ආදිය) වලින් කරන ලද සේවා.

ශීර්ෂ (ආ) (IV): පෞද්ගලික සේවා–අන්තැනක නොසඳහන්–රජක, කරණවෑමින්, ජ්‍යොතිශාස්ත්‍රඥයන්, අවමඟුල් කටයුතු භාරගන්නන් ආදීන් විසින් කරන ලද සේවා.

සංඛ්‍යා සටහන II (අ) – 7

ශීර්ෂ (අ) දළ දේශිය නිෂ්පාදිතය II (අ) 2 සංඛ්‍යා සටහනේ 3 වැනි ශීර්ෂය වන මෙම වියදම් අංශයේ පාරිභෝජන හා ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු මිලට සරිලන සේ ආධාර හැර අනියම් බදු සඳහා ද II (අ) 5 සංඛ්‍යා සටහනේ 2 වැනි ශීර්ෂය තොග මිල නොදත් වෙනස්කම් සංඛ්‍යා විශමතා (II (අ) 5 සංඛ්‍යා සටහනේ 13 වැනි ශීර්ෂය) සමග ගලපා ඇත.

සංඛ්‍යා සටහන II (අ) – 8

ශීර්ෂ 7 දළ ජාතික වියදම් පිළිබඳ (සංඛ්‍යා සටහනේ II (අ) 4) ගනු ලැබූ මේ සංඛ්‍යා සටහනේ දක්වෙන අනෙකුත් ශීර්ෂ සමග ඒකාධිකාරිත්වයක් ඇතිවනු සඳහා II (අ) 5 සංඛ්‍යා සටහනේ 3 වැනි ශීර්ෂය වශයෙන් දක්වා ඇති පවත්නා වෙළඳ මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදන වියදම් සංඛ්‍යා එම සටහනේ 13 වැනි ශීර්ෂය සමග ගළපා ඇත.

සංඛ්‍යා සටහන II (අ) - 10

මෙම සංඛ්‍යා සටහන වාර්ෂික වාර්තාවේ පලවන ප්‍රථම වාරය මෙයයි. එයින් 42 වැනි පිටුවේ ඇතුලත් පාරිභාෂිත සටහන් සාකච්ඡාකොට ඇති දළ දේශිය නිෂ්පාදිතයේ (ස්ථාවර මිල අනුව) සංශොධිත ඇස්තමේන්තු දක්වේ. මෙය පළවනුයේ කලින් වාර්ෂික වාර්තාවල පළවූ II (අ) 12 සංඛ්‍යා සටහන වෙනුවටය.

සංඛ්‍යා සටහන II (අ) – 12

පොල් සහ පොල් නිෂ්පාදිත – මේ ශීර්ෂය යටතේ කොප්පරා, කපාපු පොල් පොල් තෙල් සහ දිය පොල් ඇතුළත් වේ.